රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්

# වාර්ෂික වාර්තාව

# 2012

# පටුන


සමාගමේ පසුබිම.......... 01

දේශීය රසායනික වෙළඳපොල සහ එහි අභියෝගයන්.......... 03

සංස්ථාපිත තොරතුරු .......... 04

සමාගමේ දැක්ම මෙහෙවර ඉලක්ක සහ අරමුණු.......... 06

සභාපතිතුමාගේ සමාලෝචනය .......... 08

සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය .......... 12

2012 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව.......... 15

2013 / 2014 වර්ෂය තුළදී ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග 20

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය .......... 21

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් කොටස් හිමියන් වෙත ඉදිරිපත් කළ විගණන වාර්තාව .......... 22

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද

මූල්‍ය ප්‍රකාශන සහ සම්බන්ධ වාර්තා - විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ..........23

2012 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය.......... 24

2012 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ මූල ධනයේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය .......... 25

2012 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය..........26

2012 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා ගිණුම් සඳහා සටහන් – සංසන්දනාත්මක අනුපාතිකයන් ..........28

2012 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්..........29

2012 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයේ ගිණුම් සඳහා සටහන් ..........36

ආයතනික සැලැස්ම – උපායමාර්ගික ව්‍යාපාරික ඒකකය.......... 44

වර්තමාන සංවිධාන සැලැස්ම.......... 45

2012 වසර සඳහා මෙහෙයුම් සහ මූල්‍ය දත්ත සහ 2013 වසර සඳහා අයවැයගත සංඛ්‍යා.......... 46

සමාගමේ කාර්යසාධන ඇගයීම .......... 47

ආයතනික යහපාලනය .......... 48

විගණන කමිටු වාර්තාව ..........52

ප්‍රධාන මූල්‍යමය අවස්ථා ඇතුලත් පස් අවුරුදු සාරාංශය ..........54

රැස්වීම පිළිබඳ දැන්වීම .......... 55

## සමාගමේ පසුබිම




Left To Right
Mr.B.G. Gunawardana (Director), Mr. Mayalagu Shashikaran(Director), Mr. H.M.R. Kiriella(Director), Mr. H.A.N.S Kumara(Director), Dr. D.J.U Purasingha(Chairman), Mr. Ananda Jayasiri Gamage (Executive Director),Mr.D.Swarnapala(Ministry Observer) Mr. Ahijith Wishwamithra(Director), Mr.H.L.Vipula Silva (Board Secretary)

පරන්තන් කෙමිකල්ස් රසායන සමාගම රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ පූර්ණ වශයෙන් රජයට අයත් සමාගමක් වන අතර දේශිය කර්මාන්තවලට අවශ්‍ය ප්‍රධාන රසායනික ද්‍රව්‍යයන් වන දියර ක්ලෝරීන්, කෝස්ටික් සෝඩා සහ හයිඩ්‍රොක්ලෝරික් අම්ලය ආනයනය කර වෙළඳ පොලට සැපයීම සිදු කරනු ලබයි. දියර ක්ලෝරීන් වෙළඳ පොලේ ප්‍රධාන සැපයුම්කරුවා වන පරන්තන් කෙමිකල්ස් සමාගම අනෙකුත් රසායනික ද්‍රව්‍ය සඳහා ද වෙළඳ පොලෙන් සැලකිය යුතු කොටසකට හිමිකම් කියනු ලබයි.

1950 දශකයේ උතුරු පළාතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පරන්තන් හි රජයේ කර්මාන්තශාලාවක් වශයෙන් ආරම්භ කරන ලද පරන්තන් රසායනික කර්මාන්තශාලාව 1957 වර්ෂයේ දී පරන්තන් කෙමිකල්ස් සංස්ථාව වශයෙන් ස්ථාපනය කරන ලදී. 1957 අංක 49 දරන කාර්මික සංස්ථා පනත යටතේ ආරම්භයේ දී මෙම කර්මාන්තශාලාව මගින් දේශිය ලුණු අමුද්‍රව්‍යක් වශයෙන් භාවිතා කරමින් කෝස්ටික් සෝඩා, දියර ක්ලෝරීන්, හයිඩ්‍රොක්ලෝරික් අම්ලය ප්‍රධාන නිෂ්පාදන වශයෙන් ද සින්ක් ක්ලෝරයිඩ්, ෆෙරික් ක්ලෝරයිඩ් හා මේස ලුණු අතුරු නිෂ්පාදන වශයෙන් ද වෙළඳ පොලට ඉදිරිපත් කරන ලදී. 1985 දී ත්‍රස්තවාදී කලබල හේතුවෙන් පරන්තන් රසායනික කර්මාන්තශාලාවේ වැඩකටයුතු නවතා දමන ලද අතර දේශිය කර්මාන්තවලට එනම් ජල පිරිපහදුවට සබන් නිෂ්පාදනයට අවශ්‍ය රසායන ද්‍රව්‍ය ආනයනය කර සැපයීමට සිදු විය. කර්මාන්තශාලාව වසා දැමීම සිදු වීම මගින් විදේශ විනිමය විශාල ප්‍රමාණයක් රටින් පිටතට ඇදී ගිය අතර රැකියා අවස්ථා විශාල සංඛ්‍යාවක් ද දේශයට අහිමි විය.

දැනට ක්‍රියාත්මක වන පරන්තන් කෙමිකල්ස් සමාගම 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර ආයතන රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීමේ පොදු සමාගම් පනත යටතේ 1991 ජනවාරි 17 වන දින සංස්ථාපනය කරන ලදී. රජයට අයත් සමාගමක් වන පරන්තන් කෙමිකල්ස් සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කල අතර සමාගම් පනතින් නියම කරන ලද යහපාලන ප්‍රතිපත්ති හා රජය විසින් පනවා ඇති ප්‍රතිපත්තීන්වලට අනුකූලව කටයුතු සිදු කරනු ලබයි.

සමාගම වීසින් දේශිය වෙළඳ පොලට අවශ්‍ය දියර ක්ලෝරීන් කිලෝග්රෑම් 900 සිලින්ඩරවලින් ආනයනය කරනු ලබන අතර ඉන් කොටසක් කිලෝග්රෑම් 68 සිලින්ඩරවලට නැවත පිරවීම ආයතනයේ නැවත පිරවුම් ඒකකය මගින් සිදු කරනු ලබයි. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සමහරක් මධ්‍යස්ථානවලට හා සමහරක් සුලු පරිමාණයේ ගැනුම්කරුවන්ගේ ඉල්ලීම පරිදි ඉතා කුඩා සිලින්ඩර්වලට ක්ලෝරීන් නැවත පිරවීම සිදු කරනු ලබන අතර එමගින් සුලු පරිමාණයේ කර්මාන්තකරුවන්ට විශාල සේවයක් ඉටු කිරීමට සමාගමට හැකි වි ඇත.

ආනයනය කරනු ලබන සියලුම සිලින්ඩර් අන්තර් ජාතික තත්ත්ව පරීක්ෂණවලට යටත්ව භාවිතා කරනු ලබන අතර දේශිය නැවත පිරවුම් කටයුතු අන්තර්ජාතික තත්වයන්ට අනුකූලව සිදු කරනු ලබයි. දිවයිනේ ක්ලෝරීන් ක්ෂේත්‍රයේ විශේෂඥ දැනුම ඇති කාර්ය මණ්ඩලයක් සමාගම සතු වන අතර මේ වන විට ජලාපවහන මණ්ඩලයේ ක්ලෝරීන් භාවිතය සම්බන්ධ නිලධාරීන් පුහුණු කිරීමේ කටයුතු ද ආයතනය විසින් සිදු කරනු ලබයි.

සමාගමේ ප්‍රධාන කාර්යාලය හා ගබඩාව අංක 100/25 ශ්‍රී රාමනාදන් මාවතේ පවත්වා ගෙන යනු ලබන අතර පරන්තන් හි පිහිටි අක්කර 227 භූමිය නව කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා වෙන් කර ඇත. කළුතර නාගොඩ කර්මාන්ත පුරයේ පිහිටි අක්කර 2 1/2 ක භූමිය ක්ලෝරීන් නැවත පිරවුම් කටයුතු පරිපාලනය කිරීම සඳහා යොදා ගෙන ඇත. ආයතනයේ සමස්ත සේවක සංඛ්‍යාව 67 ක් වන අතර පසුගිය වසර කිහිපය තුලම රජයට ගෙවිය යුතු සියලුම බදු ගෙවීමෙන් පසු ලාභයේ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කර ඇත.

## දේශීය රසායනික වෙළඳපොල සහ එහි අභියෝගයන්

ශ්‍රී ලංකාවේ රසායනික වෙළඳපොල ප්‍රධාන අංග කිහිපයකින් සමන්විත වේ.

- කෘෂි රසායන
- කර්මාන්තවලට අවශ්‍ය රසායන
- රබර් කර්මාන්තයට අවශ්‍ය රසායන
- තීන්ත නිෂ්පාදනයට අවශ්‍ය රසායන
- ප්ලාස්ටික් ආශ්‍රිත කර්මාන්තයන්ට අවශ්‍ය රසායන
- ආහාර සහ බීජ නිෂ්පාදනයට අවශ්‍ය රසායන
- පුද්ගල පරිහරණයට අවශ්‍ය රසායන

රටක් වශයෙන් ශ්‍රී ලංකාව විශාල රසායනික ද්‍රව්‍ය ප්‍රමාණයක් පරිහරණයට ගන්නා අතර එම මුලු ප්‍රමාණයම වාගේ වාර්ෂිකව ආනයනය කරනු ලබයි.

පරන්තන් කෙමිකල්ස් සමාගම ප්‍රධාන වශයෙන් ජල පිරිපහදු, රසායනික සහ රබර් සහ ශීතාගාර වැනි විවිධ කර්මාන්තයන්ට අවශ්‍ය රසායනික වෙළඳපොල කටයුතු කරමින් සිටියි.

පරන්තන් කෙමිකල්ස් සමාගමට අදාළ කරගත හැකි වෙළඳපොල වටිනාකම වාර්ෂිකව රු. බිලියන 1.3 ක් පමණ වන බව තක්සේරු කර ඇත. මුලු වෙළඳපොල කෙරෙහි පරන්තන් කෙමිකල්ස් සමාගම දරණ දායකත්වය ඉහළ නැංවීමට වර්තමානයේ කටයුතු කරන අතර ඉදිරි වසර 5 තුල මුලු වෙළඳපොල තුල ප්‍රධාන සැපයුම්කරු වීමට අපේක්ෂිතය.

පරන්තන් කෙමිකල්ස් සමාගම 100% ක් රජය සතු ව්‍යවස්ථාපිත ආයතනයක් වන බැවින් නියාමක බලය භාවිතා කරමින් සමාගමේ සංයුක්ත සැලැස්ම මගින් දක්වා ඇති ඉලක්කයන් සහ අරමුණු ලඟා කර ගත හැක.

## සංස්ථාපිත තොරතුරු

| | | |
|---|---|---|
| **නීතිමය ස්වභාවය** | : | 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සීමාසහිත වගකීමකින් යුතු පොදු සමාගමක් වශයෙන් ලියාපදිංචි කර 1991 දී සංස්ථාපනය කරන ලදුව පසුව 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචිය සිදු කර ඇත. පොදු සමාගමක් බවට පත් කිරීම පොදු ව්‍යාපාර හෝ රජයට අයිති ව්‍යාපාර පොදු සමාගම් බවට පත් කිරීමේ 1987 පනත් අංක 23 ට අනුකූලව සිදු කර ඇත. පරන්තන් රසායන සමාගමට හිමිව තිබූ අධිකාරී බලය සහ ක්‍රියාකාරකම් සාංගමික සංස්ථාපත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය මඟින් නැවතත් පරන්තන් කෙමිකල්ස් සමාගමට පවරන ලදි.. |
| සංස්ථාපිත දිනය | : | 1957 දී පිහිටුවන ලද අතර, 1991 ජනවාරි 17 දින යළි නැවත සංස්ථාපනය කරන ලදි. |
| ප්‍රධාන කාර්යාලයේ ලිපිනය | : | 100/25, ශ්‍රී රාමනාදන් මාවත, කොළඹ 13, ශ්‍රී ලංකාව |
| කර්මාන්ත ඒකකය | : | පුලර්ටන් වත්ත, කළුතර |
| දු.අංක - ප්‍රධාන කාර්යාලයේ | : | +94 11 2437555-6-7; +94 11 2437831; +94 11 2387109; +94 11 2437829 |
| දු.අංක – කර්මාන්ත ඒකකය | : | +94 34 2289976 |
| ෆැක්ස් | : | +94 11 2437555 |
| විද්‍යුත් තැපැල | : | pccltd@sltnet.lk |
| වෙබ් අඩවිය | : | www.paranthanchemicals.gov.lk |
| ප්‍රධාන බැංකුකරුවෝ | : | මහජන බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සම්පත් බැංකුව සහ ලංකා බැංකුව |
| ව්‍යවස්ථාපිත විගණකවරු | : | හේමචන්ද්‍ර සහ සමාගම – වරලත් ගණකාධිකාරී |
| සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | : | ආචාර්ය ඩී. ජේ. යූ. පුරසිංහ මහතා |
| විධායක අධ්‍යක්ෂ | : | ආනන්ද ජයසිරි ගමගේ මහතා |
| අධ්‍යක්ෂ මණ්ඩලය | : | • ආචාර්ය ඩී. ජේ. යූ. පුරසිංහ මහතා<br>• ආනන්ද ජයසිරි ගමගේ මහතා<br>• එච්. එම්. ආර්. කිරිඇල්ල මහතා<br>• මායලගු ශෂිකරන් මහතා<br>• එච්. ඒ. එන්. කුමාර මහතා<br>• ජේ. ඩී. අභිජිත් විශ්වමිත්‍ර මහතා<br>• බී. පී. ගුණවර්ධන මහතා<br>• ඩී. එම්. පී. ඒ. දසනායක මහතා - 2013.06.24 විශ්‍රාම ගන්නා ලදී<br>• පී. සරත් කුමාර මහතා - 2013.09.17 විශ්‍රාම ගන්නා ලදී |
| අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | : | විපුල සිල්වා මහතා |
| ප්‍රධාන නිලධාරීන් | : | • සාමාන්‍යාධිකාරී – එස්. අනුර සිරිවර්ධන මහතා<br>• නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ඩබ්. ඩී. කීර්තිලතා මහත්මිය<br>• නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) – ඩී. එම්. ටී. එස් දිසානායක මහතා<br>• නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු) – තිස්ස ලියනගේ මහතා<br>• සහකාර සාමාන්‍යාධිකාරී(සැපයුම්) – ඩබ්. එස්. කේ. වෛද්‍යසේකර මහත්මිය<br>• සහකාර සාමාන්‍යාධිකාරී(මූල්‍ය) – කේ. ආර්. කේ. ජයවීර මහතා |
| අභ්‍යන්තර විගණක | : | ලියනගේ සහ සමාගම - වරලත් ගණකාධිකාරීවරු |

***සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය - 2013***

Chairman, Board of Directors and the Senior Management -2013
Paranthan Chemicals Company Ltd.
Ministry of State Resources and Enterprise Development



1st Row
Mr.B.G. Gunawardana (Director), Mr. Mayalagu Shashikaran(Director), Mr. H.M.R. Kiriella(Director),Mr. H.A.N.S Kumara (Director), Dr. D.J.U Purasingha(Chairman), Mr. Ananda Jayasiri Gamage (Executive Director),Mr.D.Swarnapala(Ministry Observer) Mr. Ahijith Wishwamithra(Director), Mr.H.L.Vipula Silva (Board Secretary)

2nd Row
Mr.D.M.T. Dissanayake(Dy.General Manager Marketing),Mr. Tissa Liyanage(Dy.General Manager Engineering), Mrs W.D. Keerthilatha(Dy.General Manager),Mr.Anura Siriwardane (General Manager),Mrs W.S. Waidyasekara(Asst.General Manager Supplies), Mr. K.R.K. Jayaweera (Asst.General Manager Finance)

***සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය – ප්‍රධාන කාර්යාලය*** *2012*

**Paranthan Chemicals Company Ltd.**
Chairman & the Head Office Staff - 2013
Ministry of State Resources and Enterprise Development



Left To Right

First Row
Mr.T.Liyanage,Mrs.W.S.K Waidyasekara,Mr.D.M.T.S Dissanayka,Mr.A.J.Gamage,Mr.D.J.U. Purasinghe,Mr.S.Anura Siriwardhana,Mrs.W.D.Keerthilatha,Mr.K.R.K. Jayaweera.

Second Row
Mr.P.D. Nuwan,Mrs.K.P.D. Perera,Mrs.Dulcy Lokuwithana,Mrs.K.S.Samarasinghe,Mrs.H.D.R.Y.Hewadewa,Mr.S.N.K Gunasekara,Mr.W.Nihal,MrL.D.R.D.Gokula,Mr.A.D.J Kadramer,Mrs.M.D.P Karunanayaka,Miss.B.Thavarajah,Mrs.P.I.Gunaratne.

Third Row
Mrs.K.L.D.S Subodini,Miss.N.Uresha Dilhani,Miss.K.K.D.Ruwandika,Mr.K.Ravikanth,Mr.T.S.Nalinda De Silva,Mr.A.S.Niroshan,Mr. S.D.Pathinayke,Mr.E.S.V.Nilanpriaya, Mr.K.N.Sanejeewa,Mr.L.D.G.P.Sampath,Miss.D.V.M.S. Samerasinghe,Miss.N.M.Fernando,Miss.C.K.O.Vidushika.

Forth Row
Mr.R.M.Siripala,Mrs.C.Manogarammal,Mr.k.k.Sunil,Mr.M.S.N.Kumara Silva,Mr.H.D.Ekanayake,Mr.P.D.A.Priyashantha,Mr.Antony fernando,Mr.R.P.D,Pushpakumara,Mr.C.Weerasekara,Mr.H.D.N.H.Siriwardana,Mr.H.A.N.D.Weerwsekara, Mr.J.A.J.Perera,Mr.P.D.Pradeep,Mr.S.R.A.K.Sugath.

## සමාගමේ දැක්ම, මෙහෙවර, ඉලක්ක සහ අරමුණු

**දැක්ම**

ශ්‍රී ලංකාවේ රසායනික නිෂ්පාදන හා වෙළඳපොල පෙර ගමන්කරු ලෙසත් රාජ්‍ය අනුග්‍රහය සහිත වෙළඳපොල නියාමක බලයක් සමඟ අනාගතයේ දී වෙළඳපොල තුල ස්ථාපිත වීම.

**මෙහෙවර**

මිල නියාමනය සහ ගුණාත්මකභාවය තහවුරු කරමින් කෝස්ටික් සෝඩා සහ හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය වෙළඳපොල සඳහා මැදිහත් වන අතරතුර ශ්‍රී ලංකාවේ ජල සම්පත සුපිරිසිදු බවට හරවමින් ජාතියට පිරිනැමීම.

**ඉලක්ක**

2015 වන විට ලඟා කර ගැනීම සඳහා ඉලක්ක 5 ක් සමාගම විසින් පහත දක්වා ඇත.

- ශ්‍රී ලංකාවේ රසායන වෙළඳපොල තුල නියමුවා බවට පත් වීම.
- ආයතනය තුල දැනට පවතින භෞතික සම්පත් හිඟතාවය මග හැරීම.
- සේවක තෘප්තිමත්භාවය වර්ධනය කිරීම සහ සහතික කිරීම.
- සමාගම දැනට ආනයනය කරනු ලබන රසායනික ද්‍රව්‍ය දේශීයව නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය පරන්තන් කර්මාන්තශාලාව ප්‍රතිස්ථාපනය කිරීම
- දියර ක්ලෝරීන් නිෂ්පාදනය කිරීමෙහි ලා මූලික අමුද්‍රව්‍ය වන ලුණු නිෂ්පාදනය කිරීම සඳහා අලිමංකඩ ලුණු ලේවාය නැවත ප්‍රතිස්ථාපනය කිරීම.
- ආයතනයේ ව්‍යාපාර කටයුතු වර්ෂ 2015 වන විට ව්‍යාප්ත කිරීමේ අරමුණ ඇතිව නව ව්‍යාපාර සංයෝජන කෙරෙහි යොමු වීමට අවශ්‍ය යාන්ත්‍රනයක් නිර්මාණය කොට සංවර්ධනය කිරීම.

**අරමුණු**

සමාගමේ ව්‍යවස්ථාවලියට අනුව පහත සඳහන් අරමුණු මූලික අරමුණු වශයෙන් දක්වා ඇත.

**මූලික අරමුණු**

"1955 අංක 19 දරණ පනතේ රාජ්‍ය සංස්ථා සඳහා වන වගන්තිය සහ 1956 මාර්තු 01 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 10898 දරණ අති විශේෂ ගැසට් පත්‍රය සහ පසුව සංශෝධනය කරමින් ඉදිරිපත් වූ 1957 අංක 49 දරණ රජයේ කර්මාන්ත සංස්ථා පනතේ 2 වැනි වගන්තියට අනුව සහ 1959 ජනවාරි 01 වන දින ප්‍රකාශයට පත් කරන ලද ගැසට් අංක 11, 632 ට අනුව, සංස්ථාපනය කරන ලද පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ කටයුතු කර ගැනීම හා පවත්වාගෙන යාම සඳහා,

අ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ සියලුම නිශ්චල හා චංචල දේපලවල හිමිකාරිත්වය දැරීම.

ආ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ හිමිකාරිත්වය පැවති සියලුම වත්කම් පුරස්කාර අයිතිය, අධිකාරිමය බලය, වරප්‍රසාද හා වත්කමෙන් පැන නගින අයිතීන් සඳහා හිමිකාරිත්වය දැරීම.

ඇ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ සියලුම වගකීම් දැරීම

ඈ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ ගිණුම් භාර ගැනීම, පවත්වාගෙන යාම හා ව්‍යාපාරයට අදාළ ලියකියවිලි හැසිරවීම.

ඉ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ සියලුම කොන්ත්‍රාත් සහ ව්‍යාපාර කටයුතු වෙනුවෙන් එළඹී ඇති ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම.

ඊ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාව විසින් පවත්වා ගෙන පැමිණි නීතිමය කටයුතු පවත්වා ගෙන යාම.

එ. ශ්‍රී ලංකාවේ පවත්නා නීති රීතිවලට අනුව සේවකයන් හට සමාගමේ කොටස් මිලදී ගැනීම සඳහා කොටස් භාරයක් ස්ථාපිත කිරීම.

**ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම;**

I. ඩී.ඩී.ටී. මදුරු නාශක දියර, කෝස්ටික් සෝඩා, ක්ලෝරීන්, සල්ෆියුරික් අම්ලය, පොහොර, දිලීර නාශක, කෘමිනාශක ද්‍රව්‍ය වැනි ඉහත දක්වා ඇති කෘෂිකාර්මික රසායනික ද්‍රව්‍ය, සේදුම්කාරක සහ වෙනත් රසායනික ද්‍රව්‍යයන් නිෂ්පාදනය හා විකිණීම.

II. ඉහත දක්වා ඇති නිෂ්පාදන ක්‍රියාවලින්හි දී නිපදවන හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය, සින්ක් ක්ලොරයිඩ්, පෙරික් ක්ලොරයිඩ් සහ මේස ලුණු වැනි ඕනෑම අතුරු නිෂ්පාදනයන් සංවර්ධනය කිරීම නිපදවීම හා අලෙවි කිරීම.

III. ඉහත දක්වා ඇති ඕනෑම නිෂ්පාදනයක් ආනයනය කිරීම හා විකිණීම.

IV. රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය, තොග වෙළඳාම හා සිල්ලර වෙළඳාම, තොග පවත්වා ගෙන යාම, විශ්ලේෂණ රසායනය, වියළි ලුණු නිෂ්පාදනය, තෙල් සහ වර්ණක, ආනයනය සහ අපනයනය, ප්ලාස්ටික් නිෂ්පාදනය සහ වෙළඳාම, සින්තටික් හා ෆයිබර් විශාල සහ කුඩා රසායනයන්, ඖෂධ, සාරය, පලතුරු බීම, අම්ල, රසායනික ද්‍රව්‍යයන්, කර්මාන්ත හා වෙනත් සැකසීම්, ඛනිජ සහ ජලය, පුපුරණ ද්‍රව්‍ය, වෙඩි බෙහෙත්, නිෂ්පාදන සහ සියලුම ආකාරයේ උපාංග, පණුබෙහෙත්, දිලීර නාශක, සිමෙන්ති, තීන්ත, වාර්නිෂ්, ඖෂධ, සියලුම ආකාරයේ විදුලි, රසායනික, ජායාරූපකරණය, ශල්‍ය හා විද්‍යාත්මක උපකරණ සහ සමාන ද්‍රව්‍ය හෝ සම්බන්ධිත ව්‍යාපාර, ඉහත ව්‍යාපාර වැනි දෑට යොමු වීම.

**වර්තමානයේ සමාගමේ කාර්යභාරය**

දියර ක්ලෝරීන්, කොස්ටික් සෝඩා, පතුරු සහ හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය, ආනයනය කර විකිණීම සමාගමේ ප්‍රධාන කාර්යභාරය වේ.

## සභාපතිතුමාගේ සමාලෝචනය

### පිළිගැනීම

පරන්තන් කෙමිකල්ස් සමාගමේ 22 වැනි මහා සභා රැස්වීම සඳහා සහභාගි වූ එකම කොටස්කරු වන මහා භාණ්ඩාගාරයේ ලේකම් නියෝජනය කරමින් ඔහුගේ පෙරකලාසිකරු වශයෙන් ඔබතුමා සහ අප සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුලු සියලුම පාර්ශවකරුවන් පිළිගැනීම මාගේ සතුටට හේතු වන අතර එය මාගේ වරප්‍රසාදයක් ද වේ. මෙදින 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ වාර්ෂික වාර්තාව සමඟ විගණනය කරන ලද මූල්‍ය වාර්තාව මම සතුටින් ඉදිරිපත් කරමි.

### ආර්ථික සමාලෝචනය

2012 වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තාව මගින් අදාළ වර්ෂය තුල ආයතනය මගින් කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරයක් ද ආයතනයට මුහුණ දීමට සිදු වූ ගැටලු හා සමස්ත වර්ධනය ලබා ගැනීමට හැකි වූ ආකාරය පිළිබඳ විස්තරයක් ද සපයනු ලබයි.

වසර 30 ක ත්‍රස්තවාදී කැරලිවලින් පසු 2012 වර්ෂය අවසන් වන විට රජය විසින් නිම කරන ලද මහා පරිමාණයේ යටිතල පහසුකම් ව්‍යාපෘති එනම් හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපල, ගාල්ල කොළඹ අධිවේගි මාර්ගය හා වැඩ ආරම්භ කරන ලද කොළඹ මන්නාරම සහ කොළඹ යාපනය දුම්රිය මාර්ග සහ උතුරු වසන්තය මගින් ආර්ථිකයට විශාල වර්ධනයක්, දායකත්වයක් ලබා දී තිබුණි. සමස්ත ආර්ථික වර්ධනයත් සමඟ දේශිය කර්මාන්තවල වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර එමගින් සමාගමේ ව්‍යාපාර කටයුතු වර්ධනයට ද පිටුවහලක් ලැබිණි. රජය මගින් උතුරු ප්‍රදේශයේ හා අනෙකුත් ප්‍රදේශවල ජල පිරිපහදු මධ්‍යස්ථාන ඇති කිරීම හා සුලු පරිමාණයේ කර්මාන්තකරුවන් ඔවුන්ගේ කර්මාන්තවල ධාරිතාවය වැඩි කිරීම මගින් ආයතනයේ විකුණුම්වල යහපත් වර්ධනයක් පැවතුණ ද රුපියලේ අගය පහළ බැසීම මගින් ආයතනය විසින් ආනයනය කරන ලද රසායනික ද්‍රව්‍යවල පිරිවැය ඉහළ යාම මගින් යම් අපහසුතාවයකට මුහුණ දීමට සිදු විය.

### සමාගමේ කටයුතු පිළිබඳ සමාලෝචනය

2012 වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු වර්ධන වේගයක් පෙන්නුම් කරන බව සතුටින් ප්‍රකාශ කළ හැකිය. සමාගමේ බදු පසු ලාභය රුපියල් මිලියන 37.32 වූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව 13.2% වර්ධනයක් පෙන්නුම් කරනු ලබයි. කොටසක ඉපයීම ද රුපියල් 8.24 සිට 9.33 දක්වා 13.2% ක ඉහළ වර්ධන වේගයක් පෙන්නුම් කර ඇත.

2012 වර්ෂයේ ආයතනය ඉහළ වර්ධන වේගයක් පෙන්නුම් කිරීමට සමත් වුවත් එම වර්ෂයේ දී අභියෝග රැසකට මුහුණ දීමට සිදුවිය. 2012.04.20 දින කළුතර නාගොඩ කර්මාන්තපුරයේ පිහිටි ක්ලෝරීන් නැවත පිරවුම් ඒකකයේ සිදු වූ ක්ලෝරීන් කාන්දු වීම හේතුවෙන් එම ස්ථානයේ වැඩ කටයුතු අත්හිටුවීමට සිදුවිය. ප්‍රදේශයේ ජනතාවගේ ද ප්‍රදේශයේ දේශපාලනඥයන්ගේ ද විරෝධතාවය හමුවේ එම කටයුතු එම ස්ථානයෙන් ඉවත් කර ගැනීමට සිදුවිය. ජලාපවහන මණ්ඩලයට ජලපිරිපහදුවට අවශ්‍ය ක්ලොරීන් සැපයීම අඛණ්ඩව පවත්වා ගැනීමේ අරමුණින් නැවත පිරවුම් කටයුතු හොරණ ප්‍රදේශයේ කොන්ත්‍රාත්කරුවන්ට භාර දීමට කටයුතු කරන ලද අතර එමගින් 2012 වසරේ අමතර රුපියල් මිලියන 5.8 ක පිරිවැයක් දැරීමට සිදු විය. රජයට අයත් භූමියක හෝ පුද්ගලික ඉඩමක ක්ලෝරීන් පිරවුම් කටයුතු නැවත පිහිටුවීමට අවස්ථා කිහිපයක දී උත්සාහ කරන ලද අතර එම ප්‍රදේශවල ජනතාවගේ විරෝධතාවය හමුවේ සාර්ථක කර ගැනීමට හැකි නොවීය. මේ පිළිබඳ අතිගරු ජනාධිපතිතුමා ද දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

සමාගම විසින් ක්ලෝරීන් ආනයනයේ සිට ගමනාගමනය, ගබඩා කිරීම්, නැවත පිරවීම්, පාරිභෝගිකයන් රැගෙන යාම, ඔවුන්ගේ ගබඩා කිරීම් හා භාවිතය සම්බන්ධ සම්පූර්ණ ක්‍රියාවලිය, වායුවේ තිබෙන අන්තරාදායක තත්වය අනුව අවශ්‍ය මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය උපකරණ හා රක්ෂණයන් සිදු කරන බැවින් 2013 වසරේදී සමස්ත ලාභයට ඉන් සැලකිය යුතු බලපෑමක් සිදු විය හැක. මෙය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කරන ලෙස සාමාන්‍යාධිකාරී ඇතුලු කාර්ය මණ්ඩලයට

දන්වා ඇත. මෙම වායුවේ තිබෙන අන්තරාදායක තත්වය සහ මෙහෙයුම් කටයුතුවල අපහසුතාවය නිසා පෞද්ගලික අංශය මෙම ව්‍යාපාරවලට ඇතුලු වීමට අකමැති බව පෙනී ගොස් ඇත.

ආයතනයේ නිෂ්පාදන දැකුම්කළු ලෙස ප්‍රදර්ශන කුටි මගින් සහ අලෙවි ජාලය සහ නිෂ්පාදනය සාම්ප්‍රදායික නිෂ්පාදනවලට අමතරව සිදුකල යුතුය.

සමාගම විසින් ක්ලෝරීන්වලට අමතරව නව නිෂ්පාදන කිහිපයක්ම ඇතිකිරීමට සැලසුම් කර තිබුණත් කළුතර භූමියෙහි එම කටයුතු ආරම්භ කිරීමට ප්‍රදේශවාසීන් විසින් විරෝධතාවය පළ කළ නිසා ද හොරණ කොන්ත්‍රාත්කරුවන්ගේ ස්ථානයේ සීමිත ඉඩකඩ හෙයින් ද එම කටයුතු සාර්ථකව නිම කර ගැනීමට නොහැකි විය. එම නව නිෂ්පාදනය කලට වේලාවට නිම කර ගැනීමට හැකි වූවා නම් ආයතනයේ ලාභය තවත් වැඩිකර ගැනීමට හැකි වීමට ඉඩ තිබිණි. මේ වන විට ආයතනයේ භූමියක නැවත පිරවුම් ඒකකය ස්ථාපිත කිරීමට නොහැකි වීම හේතුවෙන් එය 2013 වර්ෂයේ ලාභයට ද අයහපත් අයුරින් බලපෑමට ඉඩ ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

සමාලෝචිත වර්ෂය තුල සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂතුමා ඇතුලු අධ්‍යක්ෂවරු හයදෙනෙක්ගෙන් සමන්විත විය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය මෙම වාර්ෂික වාර්තාවේ 15 පිටුවෙහි අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ දක්වා ඇත. ප්‍රවර්තන වර්ෂය තුල සමාගමේ කටයුතු සතුටුදායක ලෙස ඉදිරියට ගෙන යාම සඳහා මාගේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් අතිමහත් සහයක් ලද බවද මෙහිදී සඳහන් කිරීමට කැමැත්තෙමි.

**මූල්‍ය ක්‍රියාකාරිත්වය**

විගණනය කරන ලද ගිණුම්වලට අනුව 2012 වර්ෂය සඳහා සමාගමේ බදු පූර්ව ලාභය වශයෙන් රුපියල් මිලියන 32.01 ක් සහ බදු පසු ශුද්ධ ලාභය වශයෙන් රුපියල් මිලියන 37.32 උපයා ඇත. මෙම වර්ෂයේ වෙළඳ කටයුතු දියර ක්ලෝරීන්, කෝස්ටික් සහ හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය ආනයනය කර විකුණුම්වලට සීමා විය.

**යෝජිත පරන්තන් කර්මාන්තශාලා භූමියේ සිදු කරන ලද සංවර්ධනය**

1956 දශකයේ සිට ක්‍රියාත්මක වූ පරන්තන් රසායන කර්මාන්තශාලාව 1985 වර්ෂයේ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් නිසා වසා දමන තෙක් අඛණ්ඩව පැවති කර්මාන්තශාලාවකි. මෙම කර්මාන්තශාලාවෙන් දේශීය වෙළඳ පොලට අවශ්‍ය දියර ක්ලෝරීන්, කෝස්ටික් සෝඩා දියර, හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය ප්‍රධාන වශයෙන් ද සින්ක් ක්ලෝරයිඩ්, ෆෙරික් ක්ලෝරයිඩ් හා මේස ලුණු අතුරු නිෂ්පාදන වශයෙන් ද ඉදිරිපත් කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ඉදිරි දැක්මෙන් පරන්තන් රසායන කර්මාන්තශාලාව නැවත ස්ථාපිත කිරීම ප්‍රමුඛතම කාර්යයක් වශයෙන් හඳුනාගෙන ඇත. පරන්තන් කර්මාන්තශාලාව නැවත ස්ථාපිත කිරීම සඳහා ආසන්න වශයෙන් රුපියල් මිලියන 3000 ක් පමණ වැය වන බවට ඇස්තමේන්තු කර ඇති අතර එම ආයෝජනය රජයෙන් ලබා ගැනීමේ අරමුණින් මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරන ලදි. එම සාකච්ඡාවට අනුව එම මුදල් රජයෙන් ලබා දීමට අපහසු බව අපහට දැනුම් දී ඇත. දේශීය හෝ විදේශීය ආයෝජකයකු මගින් මෙම ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා අවශ්‍ය සැලසුම් කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. පරන්තන් රසායනික කර්මාන්තශාලාව සඳහා ප්‍රධාන අමුද්‍රව්‍ය වශයෙන් භාවිතා කරන ලුණු ඊට ආසන්නයේ පිහිටා ඇති අලිමංකඩ ලුණු ලේවායෙන් ලබා ගැනීම සැලසුම් කර තිබුණ ද මේ වන විටත් එම ලුණු ලේවායේ නිෂ්පාදන කටයුතු ආරම්භ නොකිරීම හේතුවෙන් පරන්තන් රසායනික කර්මාන්තශාලව ආරම්භ කිරීමේ වැඩකටයුතු ප්‍රමාද වී ඇත.

කෝස්ටික් සෝඩා ව්‍යාපෘතිය මගින් ලැබෙන අතුරුඵලය වන අතිරික්ත ක්ලොරින් මනාව පාලනය කිරීම වැදගත්ය. මේ සඳහා ඩයිකැල්සියම් පොස්පේට් වැනි ව්‍යාපෘතියක් එකතු කිරීම තුලින් නිෂ්පාදිත ක්ලෝරීන්වලින් 70% පමණ එම ව්‍යාපෘතියට අන්තර්ගත කිරීමට අවශ්‍ය අධ්‍යයනයක් සිදු කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතියේ සාම්ප්‍රදායික ස්වරූපය දේශීය ඉල්ලුම අනුව සිදු කිරීමට බිලිචින් පවුඩර්, කෝස්ටික් සෝඩා වැනි දේ යෝජනා කිරීම හැකියාව ලැබීම තුලින් මෙම ව්‍යාපෘතිය සාර්ථක ව්‍යාපෘතියක් ලෙස මා සිතමි.

ඉඩමේ වටප්‍රමාණය අක්කර 227 ක් වුව ද එහි පිඹුරුපත ඇඳ ව්‍යාපෘති කාර්යාලයක් පැවැත්වීම ද සිදු කෙරේ. අයිතිය සනාථ කිරීම සහ අනෙකුත් කටයුතු සැකවින් කල යුතුය.

මේ වන විට පරන්තන් රසායනික කර්මාන්තශාලාව පිහිටි භූමියේ හමුදා කඳවුරක් පිහිටා ඇති අතර එම ඉඩමෙහි අසල්වාසීන් විසින් අනවසරයෙන් සිදු කරනු ලබන වගාකටයුතු නතර කරන ලෙසට යුද හමුදාව හරහා දැනුම් දී ඇත. පරන්තන් රසායනික කර්මාන්තශාලාවෙහි වැඩකටයුතු අලිමංකඩ ලුණු ලේවාය ආරම්භ නොකිරීම හේතුවෙන් ප්‍රමාද වන නිසා දියර ක්ලෝරීන් සහ දිය ගැසු හුණු භාවිතයෙන් බ්ලීච්න් කුඩු නිෂ්පාදන ව්‍යාපෘතියක් පරන්තන් භූමියේ ආරම්භ කිරීමට අප විසින් තීරණය කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා ආසන්න වශයෙන් රුපියල් මිලියන අනූවක් පමණ වැය වන බවට ඇස්තමේන්තු කර ඇත.

බ්ලීච්න් කුඩු ව්‍යාපෘතියට අමතරව දැනට කොන්ත්‍රාත් පදනම මත සිදු කරනු ලබන ක්ලෝරීන් නැවත පිරවුම් කටයුතු ආයතන භූමියක සමාගමේ පාලනය යටතේ සිදු කිරීමට සැලසුම් සකස් කරමින් පවතී. මනා ආරක්ෂණ තත්වයන් සහිතව නැවත පිරවුම් ඒකකය ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරේ. දැනට ආනයන අපනයන ප්‍රවාහන කටයුතු සඳහා බාහිර පාර්ශවවල සේවය ලබා ගන්නා අතර ඉදිරියේ දී අප ආයතනය සතු කන්ටේනර් රථයක් මගින් ප්‍රවාහන කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන අතර එමගින් මුදල් ඉතිරියත් අපේක්ෂා කෙරේ.

**සමාගමේ අනාගතය**

ඉදිරි කාලයේදී සැලකිය යුතු වර්ධනයක් ඇති කර ගැනීමට බලාපොරොත්තු වන අතර 2012 වර්ෂයේ දී ලබා ගත් ප්‍රගතිය ද ඉතා හොඳ මට්ටමක පවතී.

**විගණන මතය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතය වන්නේ, 2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගම නිසි ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන ඇති අතර මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 වැනි දිනට සමාගමේ තත්ත්ව විස්තරය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි ලාභය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරයි.

**නීතිමය සහ වෙනත් ව්‍යවස්ථාපිත අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරණ සමාගම් පනතේ 151 වැනි වගන්තියට අනුකූල බව විගණන මතයයි.

**පිරිනැමීම**

මාගේ රාජකාරි සහ වගකීම් ඉටුකිරීමේදී ඔවුන් විසින් දැක්වූ අනුපමේය සහයෝගය වෙනුවෙන් මාගේ හෘදයාංගම ස්තූතිය අමාත්‍යතුමන්ට, නියෝජ්‍ය අමාත්‍යතුමන්ට, රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමාට හා අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයට, මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමන්ට, අධ්‍යක්ෂ ජනරාල්තුමාට පුදකිරීමට කැමැත්තෙමි.

බාහිර විගණක හේමචන්ද්‍ර සහ සමාගමට මාගේ කෘතඥතාවය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. තවද මාගේ අධ්‍යක්ෂ මණ්ඩලයට ද, ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයට සහ සියලුම සේවකයන්ට ද ඔවුන්ගේ අපරිමිත කැපවීම හා ආයතනය කෙරෙහි ඇති ලැදියාව මෙවන් උසස් ආකාරයේ ප්‍රතිඵල ළඟා කර ගැනීමට දායක වූ බව මතක් කරමින් මාගේ කෘතඥතාවය පුද කරමි.

එමෙන්ම ආයතනයේ යහපැවැත්මට අපගේ ගනුදෙනුකාර භවතුන්ගෙන් ලත් සහය ද අගය කළ යුතු අතර 2012 වසරේ ලබා දුන් සහය 2013 වසරේ දී ද එලෙසින්ම ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

සභාපති
ආචාර්ය ඩී. ජේ. යූ. පුරසිංහ
2013 නොවැම්බර් 01 වන දින

## සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය

මෙම වසරේ ද ආයතනයේ ආදායම ප්‍රධාන වශයෙන් දියර ක්ලෝරීන් කෝස්ටික් සෝඩා හා හයිඩ්‍රෝක්ලෝරික් අම්ල මගින් ලබා ගැනිමට හැකි විය. 2012 වසරේ බදු ගෙවීමට පසු ලාභය රුපියල් මිලියන 37.32 ක් වන අතර එය පසුගිය වසරට සාපේක්ෂව 13.19% ක වර්ධනයකි. දියර ක්ලෝරීන් විකුණුම් පසුගිය වසරට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර කෝස්ටික් සෝඩා හා හයිඩ්‍රෝක්ලෝරික් අම්ල විකුණුම් පසුගිය වසරේ විකුණුම් තත්වයට ළඟා වීමට නොහැකි විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් වෙළඳ පොලේ තරඟකාරිත්වය බල පෑ අතර තරඟකරුවන්ගේ මිල ගනන් සමඟ තරඟ කිරීමට අපහසු විය. 2012 වසරේ සමාගම විසින් නව නිෂ්පාදන වශයෙන් බ්ලීචින් දියර, බ්ලීචින් කුඩු හා ඇමෝනියා කළුතර ඒකකය ආශ්‍රිතව නිෂ්පාදනය කර වෙළඳ පොලට ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබුණි. නමුත් 2012.04.20 දින කළුතර නාගොඩ කර්මාන්ත පුරයේ පිහිටි ක්ලෝරීන් නැවත පිරවුම් ඒකකයේ වැඩකටයුතු ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවය නිසා නතර කිරීමට සිදු වීම හේතුවෙන් සැලසුම් කල ආකාරයට නව නිෂ්පාදන කළුතර ඒකකයේ සිදු කිරීමට නොහැකි වූ නිසා එම නව නිෂ්පාදන නව වෙළඳ පොලට ඉදිරිපත් කිරීමට අපහසු විය. බ්ලීචින් දියර පමණක් සීමා සහිත ප්‍රමාණයන්ගෙන් හොරණ පිහිටි ක්ලොරීන් නැවත පිරවුම් ඒකක භූමියේ නිපදවා අලෙවි කිරීමට හැකි විය. එම භූමියේ සීමිත ඉඩකඩ නිසා නිෂ්පාදන පුළුල් කිරීමට අපහසු වී ඇත. ආයතනය විසින් අනාගතයේ දී ක්ලෝරීන් නැවත පිරවුම් ඒකකය ආයතනයේ භූමියක ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වන අතර එමගින් නව නිෂ්පාදන පුළුල් කිරීමට හැකියාවක් ලැබෙනු ඇත.

### ක්ලෝරීන් ආරක්ෂාකාරී ලෙස පරිහරණය සම්බන්ධයෙන් ගන්නා ලද පියවර

ආයතනය විසින් ක්ලෝරීන් ආනයනයේ සිට ගැනුම්කරුවන් විසින් ක්ලෝරීන් පරිභෝජනය කරන අවස්ථාව දක්වා සම්පූර්ණ ක්‍රියාවලිය තුල ක්ලෝරීන් භාවිතයේදී ඇතිවිය හැකි අනතුරු විශ්ලේෂණය කරන ලදී. ඒ එක් එක් අවස්ථාවලදී ඇතිවිය හැකි අනතුරු වලක්වා ගැනීමට අවශ්‍ය පියවර හැකිතාක් දුරට ස්ථාපිත කර ඇත. මේ සඳහා ආයතනය විසින් අන්තර්ජාතික විශේෂඥයන්ගේ උපදෙස් ලබා ගන්නා අතර ආයතනයේ සභාපතිතුමා සහ මම ද විදේශ කර්මාන්තශාලා තුල ඔවුන්ගේ ආරක්ෂණ ක්‍රම අධීක්ෂණය කරන ලද අතර රසායන ඉංජිනේරු විසින් ද විශේෂ පුහුණුවක් ලබා ගන්නා ලදී. ආනයනය කරනු ලබන කිලෝග්‍රෑම් 900 සිලින්ඩර් පිරවීමට පෙර සැපයුම්කරුවන් විසින් මනා පරීක්ෂණයට ලක් කරන ලද අතර අවුරුදු දෙකකට වරක් සම්පූර්ණ පරීක්ෂණ මාලාවකට ලක් කරනු ඇත. ආයතනය සතු කිලෝග්‍රෑම් 68 සිලින්ඩරවල තත්වය විශේෂ පරීක්ෂා කිරීමකට ලක්කරනු ඇත. හොරණ හා කළුතර ඒකක අවට ජීවත්වන්නන් ආවරණය වන පරිදි රුපියල් මිලියන 25ක රක්ෂණ ආවරණයක් ආයතනය විසින් ලබා ගෙන ඇත. මෙමගින් ආයතනය විසින් ආරක්ෂාව සම්බන්ධව ගත හැකි පියවර මේ වන විට ලබා ගෙන ඇතත් හොරණ ඒකකයේ පිහිටි සීමිත ඉඩකඩ නිසාත් එම වැඩපොලෙහි පරිපාලනය පුද්ගලික කොන්ත්‍රාත්කරුවකු විසින් සිදු කරන නිසාත් සමහරක් ආරක්ෂක විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික ගැටලුවකට ආයතනය මේ වන විට මුහුණ දී ඇත.

ක්ලෝරීන් ගැනුම්කරුවන්ගේ වැඩපලවල ආරක්ෂක තත්වය වර්ධනය කිරීම සඳහා එම වැඩපලවල සේවකයින් පුහුණු කිරීමේ වැඩපිළිවෙලක් ආයතනය විසින් ආරම්භ කර ඇත. ඊට අනුකූලව ජලාපවහන මණ්ඩලයේ මඩකලපුව, පුත්තලම, කුරුණෑගල හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල ජලාපවහන මණ්ඩලයේ නිලධාරීන්ට ක්ලෝරීන් භාවිතය සම්බන්ධයෙන් පුහුණුවක් ලබා දෙන ලදී. 2012 වසරේ දී අනුරාධපුර ඔයාමඩුව පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයේ දී ආයතනය විසින් ප්‍රදර්ශන කුටියක් පවත්වන ලද අතර ආයතනයේ නව රසායනය වන බ්ලීචින් කුඩු හා දියර අලෙවි ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලදී.

**මූල්‍ය අංශය**

මූල්‍ය අංශය සහකාර සාමාන්‍යාධිකාරිවරයෙකුගෙන් සහ විධායක නිලධාරීන් දෙදෙනෙකුගෙන් සහ කළමනාකරණ සහකරුවන් සත් දෙනෙකුගෙන් සමන්විතය. සලකා බලන වර්ෂය තුල දී කෙටිකාලීන සහ දිගුකාලීන ආයෝජන උපායමාර්ග සාක්ෂාත් කර ගැනීමේ දී සහ සංයුක්ත සැලසුම් සකස් කිරීමේ දී මනා සහයෝගයක් මූල්‍ය අංශය විසින් ලබා දුන්හ. යාවත්කාලීන කරන ලද මූල්‍ය තොරතුරු අමාත්‍යාංශයට සහ භාණ්ඩාගාරයට වාර්තා කිරීම ද මූල්‍ය අංශය මගින් ඉටු කෙරෙන ප්‍රධාන කාර්යයක් වශයෙන් හැඳින්විය හැක.

පසුගිය වසර තුල අපේක්ෂිත ලාභදායිත්වය ලඟා කර ගැනීම සඳහා මූල්‍ය අංශය ඍජුවද සහ වෙනත් අංශවලට සහය දෙමින් වක්‍රව අවශ්‍ය ලෙස සිය දායකත්වය ලබා දෙන ලදි. අභ්‍යන්තර පාලන ක්‍රම මත පදනම් වී කටයුතු කිරීම, ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කිරීම, බාහිර පාර්ශවයන් සමඟ යහපත් රාජකාරීමය සම්බන්ධතා පවත්වා ගෙන යාම 2012 වසරේ ඉතා ආකර්ෂණීය ප්‍රතිඵල ලඟා කර ගැනීමට ඉවහල් විය.

**අලෙවිකරණ අංශය**

විකුණුම් හා බෙදා හැරීමේ කටයුතු සියල්ල අලෙවිකරණ අංශය මඟින් මෙහෙය වනු ලබයි. එම අංශය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරියකගේ අධීක්ෂණය යටතේ කළමනාකරණ සහකාරවරුන් තිදෙනෙකු විසින් පවත්වාගෙන යනු ලබයි. මෙම අංශය ප්‍රධාන වශයෙන් දියර ක්ලෝරීන්, කෝස්ටික් සෝඩා සහ හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය දේශිය වෙළඳපොලට අලෙවි කරනු ලබයි. මෙම නිෂ්පාදිතයන්හි ගනුදෙනුකරුවන්ගේ ඉල්ලුම පුරෝකතනය, තොග පිළිබඳ ලේඛනයන් පවත්වා ගෙන යාම සහ නිරන්තරයෙන් තරඟකරුවන්ගේ මිල පරීක්ෂා කරමින් සමාගමේ මිල සංශෝධනය කිරීම කරනු ලබයි.

**සැපයුම් අංශය**

සමාගමේ මිලදී ගැනුම් සම්බන්ධව කටයුතුවල ප්‍රධාන වශයෙන් සැපයුම් අංශය නිරත වී සිටියි. මෙම අංශය සහකාර සාමාන්‍යාධිකාරිවරියකගෙන්, විධායක නිලධාරීන් දෙදෙනෙකුගෙන් සහ කළමනාකාර සහකාර දෙදෙනෙකුගෙන් සමන්විත වේ. සලකා බලන වර්ෂය තුලදි මෙම අංශය විසින් සැපයුම්කරුවන් සමග මිල අවම කර ගැනීම සඳහා මහත් පරිශ්‍රමයක් දරා ඇති අතර එය සමාගමේ ලාභදායිත්වය වර්ධනයට ධනාත්මක ලෙස බලපා ඇත.

**පරිපාලන අංශය**

පරිපාලන අංශය සේවකයින් 23 දෙනෙකුගෙන් සමන්විත විශාලම අංශය ලෙස හැඳින්විය හැක. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරියක විසින් ප්‍රධානත්වය දරණ අතර විධායක නිලධාරීන් හතරදෙනෙක්, කළමනාකරණ සහකාරවරුන් පස්දෙනෙක් සහ කායික හා ක්‍රියාකාරී සේවකයින් 12 දෙනෙකුගෙන් එම අංශය සමන්විතය. පරිපාලන අංශය මගින් සමස්ත පරිපාලනමය කර්තව්‍ය ඉටු කරනු ලබන අතර, ඊට ව්‍යවස්ථාපිත ගෙවීම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ලේඛන පවත්වාගෙන යාම, දෛනික පැමිණීමේ සටහන් පවත්වාගෙන යාම, පාර්ශවකරුවන් සමඟ සම්බන්ධතා පැවැත්වීම සහ ලිපි ගනුදෙනු, ප්‍රවාහන කටයුතු පාලනය කිරීම සහ ගොඩනැගිලි නඩත්තුව සහ මෙහෙයවීම ද පරිපාලන අංශය සතු කාර්යයන් අතර වේ.

**නැවත පිරවීමේ ඒකකය, කළුතර සහ නැවත පිරවීමේ ඒකකය, හොරණ (බාහිර සැපයුම් ඒකකයකි)**

කළුතර පුලර්ටන් කර්මාන්ත ඒකකයේ පිහිටි නැවත පිරවීමේ ඒකකය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරයෙකුගෙන් (ඉංජිනේරු), විධායක නිලධාරීන් දෙදෙනෙකුගෙන්, කළමණාකරණ සහකාරවරු සය දෙනෙකුගෙන් සහ මෙහෙයුම් සහ කාර්යය සේවකයන් දාහතර දෙනෙකුගෙන් සමන්විතය. 2011 වසර තුල දි මෙම ඒකකයේ ක්‍රියාත්මකවීම ඉතා සතුටුදායක මට්ටමක පැවති අතර නැවත පිරවීමේ කටයුතු ද ආපදාවලින් තොරව ක්‍රියාත්මක විය.

කෙසේ වුව ද 2012 අප්‍රේල් 20 වැනි දින සිදු වූ ක්ලෝරීන් කාන්දු වීමේ සිද්ධියත් සමඟ නැවත පිරවීමේ කටයුතු හොරණ ප්‍රදේශයේ පිහිටි බාහිර සැපයුම්කාර ස්ථානයකට පැවරීමට සිදු විය. මේ අතර නැවත පිරවීමේ කටයුතු සිදු කිරීමට උචිත වඩා වැඩි ඉඩකඩ සහ ප්‍රවාහන පහසුකම් සහිත ස්ථානයක් සෙවීමේ කටයුතුවල මෙම කාලය තුල නිරත වී සිටියි.



**එස්. අනුර සිරිවර්ධන**
**සාමාන්‍යාධිකාරී**
**පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්**

2013 නොවැම්බර් 01 වන දින



*කළුතර සංකීර්ණය*

**Paranthan Chemicals Company Ltd.**
Kalutara & Horana Unit Staff - 2013



Left To Right

First Row
Mrs.H.D.R.Y.Hewadewa,Mr.T.Liyanage,Mr.L.D.R.D.Gokula.

Second Row
Mrs.M.D.S.Ajantha,Mrs.R.A.Abesinghe.Mr.G.R.Dammika,Mr.E.A.M.J.Edirisinghe,Mr.H.A.Wimalasena,Mr.P.V.Sachith salinda,Mr.H.B.Piyasiri,Mr.S.A.K.Kumara.

Third Row
Mr.A.V.Keerthi Priyadewa,Mr.G.R.Weerasena,Mr.P.N.wijekulasuriya,MR.M.Moramudali,Mr.K.K.Vishvajith,Mr.W.D.Jagath Kumara,
Mr.B.K.Chaminda,Mr.R.W.Kumara,Mr.D.A.P.S.Bandara,Mr.H.T.G.K.Wikramasuriya,Mr.Premalal Silva.Mr.D.Patison.

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්තාව

සීමාසහිත පරන්තන් කෙමිකල්ස් සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය, 2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව, ගිණුම් සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශනයන් මේ සමඟ ඉදිරිපත් කරයි.

### හැඳින්වීම

ව්‍යාපාර කටයුතු ඉදිරියට කර ගෙන යාම පිණිස 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර ආයතන, රාජ්‍ය සමාගම් බවට පත් කිරීමේ පනත යටතේ පරන්තන් රසායන ද්‍රව්‍ය සංස්ථාව, රජයට අයත් සීමිත වගකීම් සහිත සමාගමක් වශයෙන් 1991.01.17 වැනි දින සංස්ථාපිත කැරිණි.

### ප්‍රධාන ක්‍රියාකාරකම්

දියර ක්ලෝරීන්, කෝස්ටික් සෝඩා ඝන පතුරු සහ හයිඩ්‍රොක්ලෝරික් අම්ලය ආනයනය කර අලෙවි කිරීම සහ කළුතර ක්ලෝරීන් නැවත පිරවුම් ඒකකයේදී කි.ගෑ. 900 සිලින්ඩර්වලින්, කි.ග්‍රෑ. 68 ධාරිතාවේ සිලින්ඩරවලට දියර ක්ලෝරීන් නැවත පිරවීම, සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

### ව්‍යාපාර සමාලෝචනය

සමාගමේ වර්ෂයේ මෙහෙයුම පිළිබඳව, සභාපතිතුමාගේ ප්‍රකාශනයේ විස්තර වශයෙන් දැක්වේ. මෙය අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වාර්තාවේ කොටසක් හා සම්බන්ධ වේ.

### අධ්‍යක්‍ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් මහත්වරුන්ගෙන් සමන්විත විය.

1. ආචාර්ය ඩී. ජේ. යූ. පුරසිංහ මහතා – සභාපති
2. ආනන්ද ජයසිරි ගමගේ මහතා – විධායක අධ්‍යක්‍ෂක
3. එච්.එම්.ආර්. කිරිඇල්ල මහතා – විධායක නොවන අධ්‍යක්‍ෂක
4. මායලගු ශෂිකරන් මහතා – විධායක නොවන අධ්‍යක්‍ෂක
5. එච්. ඒ. එන්. එස්. කුමාර මහතා – විධායක නොවන අධ්‍යක්‍ෂක - පත්වීම 2013.09.17
6. ජී. බී. ගුණවර්ධන මහතා – විධායක නොවන අධ්‍යක්‍ෂක - පත්වීම 2013.06.24
7. ජේ. ඩී. ඒ. විශ්වමිත්‍ර මහතා - විධායක නොවන අධ්‍යක්‍ෂක - පත්වීම 2013.06.24

අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් සත් දෙනෙකුගෙන් සමන්වික වන අතර ඉන් පස් දෙනෙකු විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙයි.
2012 වර්ෂය තුළ කටයුතු කළ විධායක නොවන අධ්‍යක්ෂ ඩී. එම්. පී. ඒ. දසනායක මහතා 2013.06.24 දින සිට බල පැවැත්වෙන පරිදි සහ විධායක නොවන අධ්‍යක්ෂ ජී. සරත් කුමාර මහතා 2013.09.17 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයෙන් විශ්‍රාම ගත්හ.

### අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්

සමාගම මාසිකව අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් පැවැත් වූ අතර, අවශ්‍ය අවස්ථාවලදී විශේෂ අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් ද පවත්වා ඇත. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් 11 ක් පවත්වා ඇති අතර අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්වලට අධ්‍යක්‍ෂකවරුන්ගේ සහභාගිත්වය පහත පරිදි වේ.

**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගිත්වය - 2012**

| අධ්‍යක්ෂවරු | සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| ආචාර්ය ඩී. ජේ. යූ. පුරසිංහ මහතා (සභාපති) | 11 |
| ආනන්ද ජයසිරි ගමගේ මහතා (විධායක අධ්‍යක්ෂ) | 10 |
| එච්. එම්. ආර්. කිරිඇල්ල මහතා (අධ්‍යක්ෂ) | 11 |
| ඩී. එම්. පී. ඒ. දසනායක මහතා (අධ්‍යක්ෂ) | 11 |
| පී. සරත් කුමාර මහතා (අධ්‍යක්ෂ) | 11 |
| මායලගු ශෂිකරන් මහතා (අධ්‍යක්ෂ) | 10 |

**කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම**

ආචාර්ය ඩී. ජේ. යූ. පුරසිංහ මහතා (සභාපති), ඒ. ජේ. ගමගේ (විධායක අධ්‍යක්ෂ), ඩී. එම්. පී. ඒ. දසනායක, පී. සරත් කුමාර, එච්. එම්. ආර්. කිරිඇල්ල සහ එම්. ශෂිකරන් යන මහත්වරුන් වර්ෂය තුළදී අධ්‍යක්ෂවරු වශයෙන් කටයුතු කළ අතර, ආයතනය සමඟ කිසිදු සෘජු හෝ වක්‍ර ආකාරයේ ඇල්මක් නොපැවති බව සනාථ කර ඇත.

**අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශනය**

2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධාන සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් සැකසීමේදී අදාළ වන නීති සහ වෙනත් රෙගුලාසි අනුගමනය කිරීම සහතික කිරීම පිළිබඳව සමාගමේ අධ්‍යක්ෂවරු වගකිව යුතු වේ.

මූල්‍ය තත්වය අනාවරණය වන අයුරින් සාධාරණ නිරවද්‍යතාවයක් සහිතව සමාගමේ ගිණුම් වාර්තා පවත්වා ගැනීමෙහිලා අධ්‍යක්ෂවරු සමාන ලෙස වගකිව යුතු වේ.

ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනයන්හි අඛණ්ඩ පැවැත්ම සහ විෂය මූලිකත්වය පිළිබඳ වගකීම අධ්‍යක්ෂවරු භාර ගන්නා අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙළ කිරීමේදී පහත දැක්වෙන නීති අනුගමනය කැරෙන බවද ස්ථිර කරති.

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කෙරුණු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්.
- නියමිත ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගෙන අනුරූපව යොදා ගැනීම.
- මූල්‍ය ප්‍රකාශනයන්හි සත්‍ය සහ පැහැදිලි මතයක් පිළිබිඹු වීම පිණිස විචක්ෂණ සහ සාධාරණ පදනමක් මත මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වන ඇස්තමේන්තු සහ විනිශ්චයන්.

වත්කම් ආරක්ෂා කර ගැනීමෙහිලා සමාගම විසින් නියමිත, ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනය කිරීම් සහ ගිණුම් වාර්තා යොදා ගෙන ඇත. පසුගිය වාර්ෂික මහා සභා රැස්වීමේදී සම්මත කෙරුණු යෝජනාවකට අනුකූලව සමාගමේ බාහිර විගණක හේමචන්ද්‍ර සහ සමාගම යලි පත් කෙරිණි. මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ ඔවුන්ගේ මතය දැක්වීම පිණිස උචිත බවට ඔවුන් විසින් සැලකිල්ලට ගන්නා ලද අවශ්‍ය පිරික්සා බැලීම් කර ගෙන යෑම සඳහා, නිදහස් ප්‍රවේශයන් ඔවුන් වෙත සැපයිණි. මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළව ඔවුන්ගේ වගකීම්, පසුව එන පිටුවේ දැක්වෙන විගණක වාර්තාවේ විදහා පෙන්වයි.

**අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම පිළිබඳ ලේඛනය**

අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම පිළිබඳ ලේඛනය 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව පවත්වාගෙන යනු ලබයි.

**අධ්‍යක්ෂවරුන්ගේ සංවේතන**

2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගම සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ වේතනය, මූල්‍ය ප්‍රකාශනයන්හි 4 වැනි සටහනේ දැක් වේ.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

රජයට ආනයන බදු, තීරු බදු ආදිය ගෙවීමෙන් කෙරෙන සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සේවකයින්ට අදාළ වන ව්‍යවස්ථාපිත ගෙවීම්, තම උපරිම දැනීමේ සහ විශ්වාසයේ හැටියට, සමාගම විසින් නිසි පරිදි ගරු කර ඇති බවට සමාගමේ අධ්‍යක්ෂවරු සෑහීමට පත් වෙති.

**දේපල යන්ත්‍රාගාර සහ උපකරණ**

සමාලෝචිත වර්ෂය තුල දේපල, යන්ත්‍රාගාර සහ උපකරණවල සැලකිය යුතු වෙනස්වීම්, 38 පිටුවේ ගිණුම් සඳහා 8 වැනි සටහනේ දැක්වේ.

**ලාභාංශ ගෙවීම්**

2011 වර්ෂය සඳහා රු. මිලියන 3 ක ලාභාංශයක් සමාගමේ එකම කොටස්කරු වන භාණ්ඩාගාර ලේකම් වෙත ගෙවා ඇත.

**යෝජිත අවසන් ලාභාංශ**

2012 වර්ෂය සඳහා රු. මිලියන 5 ක ලාභාංශයක් යෝජනා කරන ලදුව සම්මත විය.

**විගණකවරයා**

සමාලෝචිත වර්ෂය තුල සමාගමේ විගණකවරයා, වරලත් ගණකාධිකාරීවරු වන හේමචන්ද්‍ර සහ සමාගම විය.

වර්ෂය සඳහා විගණක ගාස්තු වශයෙන් රු. 66,300.00 ක් ප්‍රතිපාදනය කර ඇත. තම නිදහසට හානි වනු ඇති කිසිදු සම්බන්ධතාවයක් හෝ කිසිදු ඇල්මක් විගණකවරුන් විසින් සමාගම සමඟ පවත්වා නොමැත.

**ණය ගෙවීමට ප්‍රමාණවත් වත්කම් ඇති බවට පරීක්ෂණය**

ලාභාංශය යෝජනා කළ වහාම අධ්‍යක්ෂවරුන් විසින් සමාගම සතුව ණය ගෙවීමට ප්‍රමාණවත් වත්කම් ඇති බවට තක්සේරු කර ඇති අතර 2007 අංක 07 දරණ සමාගම් පනතෙන් නියමිත ණය ගෙවීමට ප්‍රමාණවත් වත්කම් ඇති බවට පරීක්ෂණය සමාගම විසින් සපුරා ඇති බව ස්ථිර කර ඇත.

**වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මූල්‍ය ප්‍රකාශනයන් සැකසීමේදී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, 28 වැනි පිටුවේ සිට 34 වැනි පිටුව දක්වා සඳහන් කර ඇත. සමාලෝචිත වර්ෂය තුල, සමාගම විසින් යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනසක් සිදු වී නොමැත.

**අනාගතය පිළිබඳ පෙර දැක්ම**

අනාගතය පිළිබඳ 'මහින්ද චින්තන' පෙර දැක්ම යථාර්තයක් බවට පත් කරමින් පරන්තන් ක්ලෝරීන් කර්මාන්තශාලාව යළි නගා සිටුවීම අපගේ දැක්ම වේ.


**විගණන කමිටුව**

විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය. අභ්‍යන්තර පාලන පද්ධති, ව්‍යවස්ථාපිත මූල්‍ය ප්‍රකාශනයන් සහ කළමනාකරණ ගිණුම් පිළිබඳ කාර්යක්ෂමතාව සම්බන්ධව විගණන කමිටුව විසින් නිරතුරුවම සමාලෝචනය කරන ලදි.

**කෘතඥතාවය**

වර්තමාන ප්‍රගමනය කරා ලඟා වීමෙහි ලා අප ගැණුම්කරුවන්ගෙන් ලද අනවරත සහාය සහ කාර්ය මණ්ඩලය විසින් දක්වන ලද සහයෝගිතාව, කැපවීම සහ දරණ ලද ප්‍රයත්නයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අගය කරනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,**





**මායලඟු ශෂිකරන්**
**අධ්‍යක්ෂ**

**එච්. එම්. ආර්. කිරිඇල්ල**
**අධ්‍යක්ෂ**

**2013 නොවැම්බර් 01 වන දින**

*2012 වසරේ දි කර්මාන්ත ඒකකයේ නැවත පිරවීමේ කටයුතු සිලින්ඩර් නඩත්තු හා කර්මාන්තයේ ආරක්ෂාව පිළිබඳ සැලකිල්ල*









## 2013 / 2014 වර්ෂය තුලදී ආයතනයේ කාර්යය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනිමට අපේක්ෂිත මධ්‍යකාලින ක්‍රියාමාර්ග

ආයතනය විසින් 2013 වසර සඳහා රුපියල් මිලියන 273.00 විකුණුම් ප්‍රමාණයක් සහ රුපියල් මිලියන 28.34 බදු ගෙවීමට පසු ලාභයත් ඇස්තමේන්තු කර ඇත. වාර්ෂිකව ක්ලෝරීන් විකුණුම් වර්ධනය කිරීමටත් කොස්ටික් සෝඩා හා ක්ලෝරීන් විකුණුම් සඳහා මනා සැලසුම් සහිතව එම තරඟකරුවන් සමඟ තරඟ කිරීමටත් සැලසුම් සකස් කර ඇත. මේ වන විට ආයතනය විසින් අඩු පිරිවැය යටතේ කෝස්ටික් සෝඩා හා හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය විකුණුම් වැඩි කර ගැනිමට අපේක්ෂා කෙරේ.

මේ වන විට දේශිය භාවිතය සඳහා අවශ්‍ය සම්පූර්ණ බ්ලීචින් කුඩු ප්‍රමාණය සැපයුම්කරුවන් විසින් ආනයනය කර සපයනු ලබන අතර ආයතනය විසින් 2014 වසරේදී බ්ලීචින් පවුඩර් කර්මාන්තශාලාවක් ආරම්භ කර මෙම වෙළඳපොල අත්කර ගැනිමට සැලසුම් කර ඇත. වෙළඳ පොලට අවශ්‍ය බ්ලීචින් පවුඩර් ප්‍රමාණය සැපයීම මගින් වසරකට රුපියල් මිලියන 120 ක් පමණ විකුණුම් ආදායමක් ලබා ගැනිමට අපේක්ෂා කෙරේ. ඊට සමගාමීව රුපියල් මිලියන 19 ක පමණ ලාභයක් සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘති කටයුතු පහසු කිරීම සඳහා පරන්තන් භූමියේ ව්‍යාපෘති කාර්යාලයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන අතර එමගින් පරන්තන් කෝස්ටික් සෝඩා හා ක්ලෝරීන් කර්මාන්තශාලාව පිහිටුවීමට රුකුලක් ද ලැබේ.

කොන්ත්‍රාත්කරුවකු මගින් දැනට ක්ලෝරීන් නැවත පිරවීම සිදුකරනු ලබන අතර එමගින් ආයතනයට වසරකට රුපියල් මිලියන 8ක් පමණ අමතර පිරිවැයක් දැරීමට සිදු වී ඇත. ක්ලෝරීන් පිරවුම් ඒකකය නැවතත් ආයතනය සතු ඉඩමකට ගෙන යාමටත් එමගින් පිටතට ඇදී යන වියදම නතර කිරීමටත් අපේක්ෂා කෙරේ.

ඉදිරි වසරේ දි පරන්තන් රසායනික කර්මාන්තශාලාව ආරම්භ කිරීමට ප්‍රධානතම අමුද්‍රව්‍ය වන ලුණු සැපයීමට බලාපොරොත්තු වන අලිමංකඩ ලුණු ලේවාය නැවත ආරම්භ කිරීමට අවශ්‍ය පෙළඹවීම ආයතනය විසින් සිදු කරනු ලබයි. ලුණු ලේවාය පරන්තන් ව්‍යාපෘතියේ කොටසක් ලෙස ඇතුලත් වනු දැකිම ආයතනයේ බලාපොරොත්තුව වන අතර ඒ සඳහා අවශ්‍ය වැඩකටයුතු ඉදිරි වර්ෂයේදී සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

ආයතනයේ ප්‍රධාන කාර්යාලය අංක 100/25, ශ්‍රී රාමනාදන් මාවත, කොළඹ 13. වරාය අධිකාරියට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර එය නැවතත් භාර දෙන ලෙස ඉල්ලා ඇත. මෙම ගොඩනැගිල්ල අබලන් වී ඇති අතර ඇති ඉඩකඩ ද සේවක මණ්ඩලයට ප්‍රමාණවත් නොමැත. 2014 දි ආයතනයේ ප්‍රධාන කාර්යාලය මෙම ස්ථානයෙන් ඉවත් කර පහසුකම් සහිත ගොඩනැගිල්ලකට ස්ථාන ගත කිරීමට අදහස් කර ඇත.

**අධ්‍යක්‍ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය**

***<u>අධ්‍යක්‍ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය</u>***

2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධාන සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් සැකසීමේදී අදාළ වන නීති සහ වෙනත් රෙගුලාසි අනුගමනය කිරීම සහතික කිරීම පිළිබඳව සමාගමේ අධ්‍යක්‍ෂවරු වගකිව යුතු වේ.

මූල්‍ය තත්ත්වය අනාවරණය වන අයුරින් සාධාරණ නිරවද්‍යතාවයක් සහිතව සමාගමේ ගිණුම් වාර්තා පවත්වා ගැනීමේලා අධ්‍යක්‍ෂවරු සමාන ලෙස වගකිව යුතු වේ.

ඉදිරිපත් කැරෙන මූල්‍ය ප්‍රකාශනයන්හි අඛණ්ඩ පැවැත්ම සහ විෂය මූලිකත්වය පිළිබඳ වගකීම අධ්‍යක්‍ෂවරු භාර ගන්නා අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙළ කිරීමේදී පහත දැක්වෙන නීති අනුගමනය කැරෙන බවද ස්ථිර කරති.

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කැරුණු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්.
- නියමිත ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගෙන අනුරූපව යොදා ගැනීම
- මූල්‍ය ප්‍රකාශනයන්හි සත්‍ය සහ පැහැදිලි මතයක් පිළිබිඹු වීම පිණිස විචක්ෂණ සහ සාධාරණ පදනමක් මත මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වන ඇස්තමේන්තු සහ විනිශ්චයන්.

වත්කම් ආරක්ෂා කර ගැනීමේලා සමාගම විසින් නියමිත සහ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනය කිරීම් සහ ගිණුම් වාර්තා යොදා ගෙන ඇත. පසුගිය වාර්ෂික මහා සභා රැස්වීමේදී සම්මත කැරුණු යෝජනාවකට අනුකූලව සමාගමේ බාහිර විගණක හේමචන්ද්‍ර සහ සමාගම යලි පත් කැරිණි. මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ ඔවුන්ගේ මතය දැක්වීම පිණිස උචිත බවට ඔවුන් විසින් සැලකිල්ලට ගන්නා ලද අවශ්‍ය පිරික්සා බැලීම් කර ගෙන යෑම සඳහා, නිදහස් ප්‍රවේශයන් ඔවුන් වෙත සැපයිණි. මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළව ඔවුන්ගේ වගකීම්, පසුව එන පිටුවේ දැක්වෙන විගණක වාර්තාවේ විදහා පෙන්වයි.

**ඩී. ජේ. යූ. පුරසිංහ**
**සභාපති**
**2013 නොවැම්බර් 26 වන දින**

එච්.පී.ඒ.ආර්.එස්. හේමචන්ද FCA
හේමචන්ද සහ සමාගම
වරලත් ගණකාධිකාරී

11, විජයබා මාවත, නාවල පාර, නුගේගොඩ.
ශ්‍රී ලංකාව.
දු.අංක. :+94 11 2829797 ෆැක්ස් : +91 11 2812803
වි.තැ.: hamaco@sltnet.lk

**කොටස් හිමියන් වෙත ඉදිරිපත් කෙරුණු විගණක වාර්තාව**
**පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්**

**මූල්‍ය ප්‍රකාශන මත වාර්තාව**

මේ සමඟ ඇති පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් හි 2012 දෙසැම්බර් 31 වැනි දිනට වූ ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ද, වෙනත් පැහැදිලි කිරීමේ සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදි.

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමණාකාරීත්වයේ වගකීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර සාධාරණව ඉදිරිපත් කිරීම සඳහා කළමණාකාරීත්වය වගකීමෙන් බැඳේ. මෙම වගකීමට, වංචා හේතුවෙන් හෝ වැරදි හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක අවප්‍රකාශනවලින් තොර මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හා සාධාරණව ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගැනීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම හා ව්‍යවහාර කිරීම සහ අවස්ථානුකූලව සාධාරණ වන්නාවූ ගිණුම්කරණ ඇස්තමේන්තු සැකසීමත් ඇතුළත් වේ.

**විගණන විෂයපථය හා මතයේ පදනම**

අපගේ වගකීම වන්නේ අපගේ විගණනය පදනම් කරගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමයි. අපගේ විගණනය අප විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස අප විසින් විගණනය සැලසුම් කර ඉටු කිරීමට එම ප්‍රමිතිවලින් අවශ්‍ය කෙරේ.

මූල්‍ය ප්‍රකාශනවල අගයන් හා හෙළිදරව් කිරීම් සනාථ කිරීම සඳහා උපකාරී වන සාක්ෂි සෝදිසි පදනමක් මත පරීක්ෂා කිරීම විගණනයට ඇතුළත් වේ. භාවිතා කළ ගිණුම්කරණ මූලධර්ම සහ කළමණාකාරීත්වය විසින් කරන ලද වැදගත් ඇස්තමේන්තු තක්සේරු කිරීම මෙන්ම සමස්ථ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ඇගයීමද විගණනයට ඇතුලත් වේ.
අපගේ උපරිම දැනීම හා විශ්වාසය අනුව අපගේ විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් අපි ලබා ගතිමු. එසේ හෙයින් අපගේ විගණනයෙන් අපගේ මතය සඳහා සාධාරණ පදනමක් සපයන්නේ යැයි අපි විශ්වාස කරමු.

**විගණන මතය**

අපගේ පරීක්ෂණයන්ගෙන් පෙනී යන අන්දමට 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගම නිසි ගිණුම්කරණ වාර්තා පවත්වා ගෙන ඇති අතර මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 වැනි දිනට සමාගමේ ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි ලාභය හා මුදල් ප්‍රවාහ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරයි.

**වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

මෙම මූල්‍ය ප්‍රකාශනයන්, 2007 අංක 07 දරණ සමාගම් පනතේ 15 (1) වැනි වගන්තියේ නියමයන්ට ද අනුකූල වේ.

**අත්සන් කලේ,**

**හේමචන්ද සහ සමාගම**
**වරලත් ගණකාධිකාරී**
**2013 නොවැම්බර් 26 වන දින**

**පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්**

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**

**2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| | සටහන් | 2012 | 2011 |
|---|---|---|---|
| | | රු. | රු. |
| ආදායම | 1 | 217,294,221 | 186,898,881 |
| විකුණුම් පිරිවැය | 2 | (125,823,189) | (98,658,356) |
| දළ ලාභය | | 91,471,032 | 88,240,525 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 3 | 15,633,150 | 5,666,039 |
| | | 107,104,182 | 93,906,564 |
| **වියදම්** | | | |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | | 2,554,403 | 2,757,642 |
| පරිපාලන සහ ආයතන වියදම් | | (72,438,138) | 63,301,162 |
| | | (74,992,541) | (66,058,804) |
| මෙහෙයුම් කටයුතුවලින් ලැබෙන ලාභය/(පාඩුව) | | 32,111,641 | 27,847,760 |
| මූල්‍ය වියදම් | 4 | (95,792) | (136,125) |
| බදු පූර්ව ලාභය/(පාඩුව) | | 32,015,849 | 27,711,635 |
| බදු අය කිරීම | 5 | 5,309,622 | 5,260,991 |
| බදු ගෙවීමට පසු ශුද්ධ ලාභය/(පාඩුව) | | 37,325,471 | 32,972,626 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| දේපල යන්ත්‍රාගාර උපකරණ ප්‍රත්‍යාගණන ලාභය/(පාඩුව) | | - | - |
| මූල්‍ය වත්කම් විකිණීමෙන් අත්විය හැකි ලාභය/(පාඩුව) | | - | - |
| විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම | | - | - |
| විස්තීර්ණ ආදායම් මත ඇති වන බදු වගකීම | | - | - |
| වෙනත් විස්තීර්ණ ආදායම් මත ඇති වන ශුද්ධ බදු ගෙවීම | | - | - |
| ***වර්ෂය සඳහා මුලු විස්තීර්ණ ආදායම*** | | 37,325,471 | 32,972,626 |
| කොටසකට ඉපැයීම (රු.) | 6 | 9.33 | 8.24 |
| කොටසකට ලාභාංශය (රු.) | 7 | 0.75 | 0.75 |

**පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්**

**මූල්‍ය තත්ව ප්‍රකාශය**

**2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| වත්කම් | සටහන | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | රු. | රු. | රු. |
| දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ | 8 | 273,854,360 | 275,366,807 | 284,545,208 |
| කෙරී ගෙන යන වැඩ | | 744,330 | 744,330 | 1,319,330 |
| | | 274,598,690 | 276,111,137 | 285,864,538 |
| **ජංගම වත්කම්** | | | | |
| වෙළඳ තොගය | 9 | 16,998,263 | 24,750,631 | 23,691,745 |
| වෙළඳ හා වෙනත් ලැබීම් | 10 | 21,023,183 | 18,541,658 | 13,875,495 |
| කාර්ය මණ්ඩල සහ වෙනත් ණය ගැතියන් | 11 | 14,192,636 | 12,213,083 | 23,353,374 |
| තැන්පතු, පූර්ව ගෙවීම් හා අත්තිකාරම් | 12 | 6,527,791 | 3,750,809 | 3,811,202 |
| කෙටි කාලීන ආයෝජන | 13 | 133,378,267 | 58,604,510 | 69,391,255 |
| මුදල් සහ මුදල් හා සමාන දේ | 14 | 1,135,033 | 48,257,323 | 5,505,623 |
| **මුළු ජංගම වත්කම්** | | 193,255,174 | 166,118,014 | 139,628,694 |
| **මුළු වත්කම්** | | 467,853,863 | 442,229,150 | 425,493,232 |
| **ස්කන්ධ මූල ධනය සහ බැරකම්** | | | | |
| **මූල ධනය සහ සංචිත** | | | | |
| ප්‍රකාශිත මූල ධනය | 15 | 108,500,000 | 108,500,000 | 108,500,000 |
| රඳවා ගත් ලාභය | | 67,963,672 | 33,638,201 | 2,676,770 |
| වෙනත් ස්කන්ධ මූල ධන අයිතමයන් | 16 | 220,795,490 | 220,795,490 | 220,795,490 |
| | | 397,259,162 | 362,933,691 | 331,972,260 |
| **ජංගම නොවන බැරකම්** | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | 17 | 6,286,406 | 6,340,393 | 5,241,611 |
| විලම්බිත බදු | 18 | 32,029,950 | 44,361,740 | 58,717,596 |
| | | 38,316,356 | 50,702,133 | 63,959,207 |
| **ජංගම බැරකම්** | | | | |
| වෙළඳ ණය හිමියන් සහ අනෙකුත් ගෙවීම් | 19 | 32,278,345 | 28,593,326 | 29,561,765 |
| **මුළු ජංගම බැරකම්** | | 32,278,345 | 28,593,326 | 29,561,765 |
| **මුළු ස්කන්ධ මූල ධනය සහ බැරකම්** | | 467,853,863 | 442,229,150 | 425,493,232 |

මූල්‍ය ප්‍රකාශනයන් 2007 අංක 7 දරණ සමාගම් පනතේ නියමයන්ට අනුකූලව පිළියෙළ කර ඇති බවට මම සහතික කරමි.

මූල්‍ය අංශ ප්‍රධාන

මෙම මූල්‍ය ප්‍රකාශනයන් සැකසීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

මෙම මූල්‍ය ප්‍රකාශනයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

*ජේ. ඩී. යූ. පුරසිංහ*
*සභාපති*

*එච්. එම්. ආර්. කිරිඇල්ල අධ්‍යක්ෂ*

29 වැනි පිටුවේ සිට 46 වැනි පිටුව දක්වා ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්වලින් මූල්‍ය ප්‍රකාශනවල සමස්තය පෙන්නුම් කෙරේ.

2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | ප්‍රකාශිත මූල ධනය | ප්‍රාග්ධන සංචිතය | වෙනත් ස්කන්ධ මූලධන අයිතමයන් | සමුච්චිත ලාභය/(පාඩුව) | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2010.01.01 දිනට ශේෂය | 40,000,000.00 | 68,500,000.00 | - | 54,976,734.33 | 163,476,734.33 |
| ගිණුම් ප්‍රතිපත්තියේ සිදු වූ වෙනස්කම් නිසා | | | | | |
| 2010.01.01 දිනට නැවත ප්‍රතිෂ්ඨාපනය කල අග | 40,000,000.00 | 68,500,000.00 | - | 54,976,734.33 | 163,476,734.33 |
| | 40,000,000.00 | 68,500,000.00 | - | 54,976,734.33 | 163,476,734.33 |
| වෙනත් ප්‍රත්‍යාගණන අතිරික්ත | - | - | 220,795,490.02 | - | 220,795,490.02 |
| SLFRS ගැලපුම් | - | - | - | (57,717,978.57) | (57,717,978.57) |
| ලාභාංශ ගෙවීම් | - | - | - | (3,000,000.00) | (3,000,000.00) |
| 2010 වර්ෂය සඳහා අතුරු ලාභාංශ | - | - | - | (1,000,000.00) | (1,000,000.00) |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(පාඩුව) | - | - | - | 9,418,013.93 | 9,418,013.93 |
| 2010.12.31 දිනට ශේෂය | 40,000,000.00 | 68,500,000.00 | 220,795,490.02 | 2,676,769.69 | 331,972,259.71 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | - | - | - |
| | | | | | - |
| SLFRS ගැලපුම් | - | - | - | (11,195.00) | (11,195.00) |
| ලාභාංශ ගෙවීම් | - | - | - | (2,000,000.00) | (2,000,000.00) |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(පාඩුව) | - | - | - | 32,972,625.98 | 32,972,625.98 |
| 2011.12.31 දිනට නැවත ප්‍රතිෂ්ඨාපනය කල ශේ | 40,000,000.00 | 68,500,000.00 | 220,795,490.02 | 33,638,200.67 | 362,933,690.69 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | - | - | - |
| වෙනත් ලාභාංශ ගෙවීම් | - | - | - | (3,000,000.00) | (3,000,000.00) |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(පාඩුව) | - | - | - | 37,325,471.46 | 37,325,471.46 |
| 2012.12.31 දිනට නැවත ප්‍රතිෂ්ඨාපනය කල ශේ | 40,000,000.00 | 68,500,000.00 | 220,795,490.02 | 67,963,672.13 | 397,259,162.15 |

**පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**
**2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| | | 2012 | 2011 |
|---|---|---|---|
| | | රු. | රු. |
| බදු පූර්ව ශුද්ධ ලාභය/(පාඩුව) | සටහන ඒ | 18,080,354 | 22,864,407 |
| **ගැලපුම්** | | | |
| ක්ෂය ප්‍රතිපාදනය | | 14,059,720 | 13,848,797 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් ලාභය/(පාඩුව) | | (40,750) | (32,150) |
| පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදනය | | 838,395 | 1,535,035 |
| සේවක ණය පොලි වියදම | | 731,345 | 576,533 |
| **කාරක මූල ධනය වෙනස් විමට පෙර මෙහෙයුම් ලාභය** | | 33,669,064 | 38,792,622 |
| වෙළඳ තොගයේ (වැඩි විම)/අඩු විම | | 7,752,368 | (1,058,886) |
| වෙළඳ සහ වෙනත් ලැබිම්වල (වැඩි විම)/අඩු විම | | (2,481,525) | (4,666,163) |
| කාර්ය මණ්ඩල සහ අනෙකුත් ණය ගැතියන්ගේ (වැඩි විම)/අඩු විම | | (1,979,553) | 11,140,291 |
| තැන්පතු පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්වල (වැඩි විම)/අඩු විම | | (2,776,982) | 60,393 |
| වෙළඳ සහ අනෙකුත් ගෙවීම්වල වැඩි විම/(අඩු විම) | | 4,014,140 | (544,630) |
| | | 4,528,448 | 4,931,005 |
| **මෙහෙයුම් කටයුතුවලින් ජනනය කැරුණු මුදල්** | | 38,197,512 | 43,723,627 |
| ගෙවන ලද ආදායම් බදු | | (7,351,290) | (9,357,830) |
| ගෙවන ලද පාරිතෝෂික | | (892,382) | (436,253) |
| **මෙහෙයුම් කටයුතුවලින් ජනනය කැරුණු ශුද්ධ මුදල** | | 29,953,840 | 33,929,544 |
| **ආයෝජන කටයුතුවලින් ලද :භාවිතා කැරුණු-මුදල් ප්‍රවාහය** | | | |
| පොලි ආදායම | | 13,204,150 | 4,553,470 |
| දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ මිලට ගැනිම | | (12,551,084) | (3,805,879) |
| දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ විකුණිමෙන් ලත් මුදල | | 44,561 | 32,150 |
| කෙරිගෙන යන වැඩ | | - | (744,330) |
| ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ | | 697,627 | 35,411 |
| **මූල්‍ය කටයුතුවල :භාවිතා කැරුණු- මුදල් ප්‍රවාහය** | | | |
| ගෙවන ලද ලාභාංශ | | (3,000,000) | (2,000,000) |
| ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ | | (3,000,000) | (2,000,000) |
| **මුදල් සහ මුදල් හා සමාන දේවල ශුද්ධ වැඩි විම/(අඩු** | | 27,651,467 | 31,964,955 |
| **වර්ෂය ආරම්භයේදි මුදල් සහ මුදල් හා සමාන දේ** | **(ආ සටහන)** | 106,861,833 | 74,896,878 |
| **වර්ෂය අවසානයේදි මුදල් සහ මුදල් හා සමාන දේ** | **(ආ සටහන)** | 134,513,300 | 106,861,833 |

**සටහන ඒ**

| පොලිය සහ බදු පූර්ව ශුද්ධ ලාභය | 2012 | 2011 |
|---|---|---|
| | Rs. | Rs. |
| බදු පූර්ව සහ පොලිය ගෙවීමට පසු ශුද්ධ ලාභය | 32,015,849 | 27,711,635 |
| ʼගැලපුම් :- පොලී ආදායම | (13,935,495) | (4,847,228) |
| පොලිය සහ බදු පූර්ව ශුද්ධ ලාභය | 18,080,354 | 22,864,407 |

**ආ. සටහන**

| කාල සීමාව අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | 2012 | 2011 |
|---|---|---|
| | Rs. | Rs. |
| ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව | 25,000,000 | - |
| ඒක්ෂණ තැන්පතු - සම්පත් බැංකුව | - | 14,962,814 |
| ස්ථාවර තැන්පතු - හැටන් නැෂනල් බැංකුව | 3,171,657 | 3,000,000 |
| ස්ථාවර තැන්පතු - හැටන් නැෂනල් බැංකුව | 3,975,997 | 3,588,965 |
| නැවත මිලදී ගැනීමේ ගිවිසුම් - මහජන බැංකුව | 20,256,289 | 18,647,915 |
| නැවත මිලදී ගැනීමේ ගිවිසුම් - මහජන බැංකුව | 4,026,315 | 3,723,631 |
| නැවත මිලදී ගැනීමේ ගිවිසුම් - මහජන බැංකුව | 2,074,927 | 1,877,343 |
| නැවත මිලදී ගැනීමේ ගිවිසුම් - මහජන බැංකුව | 32,600,000 | - |
| ස්ථාවර තැනපතු - මහජන බැංකුව | 6,094,433 | 5,500,000 |
| ස්ථාවර තැනපතු - මහජන බැංකුව | 7,275,074 | 6,608,491 |
| ස්ථාවර තැනපතු - මහජන බැංකුව | 26,665,810 | - |
| ඒක්ෂණ තැන්පතුවලින් පොලිය ලැබීම් | 2,237,765 | 695,351 |
| තැන්පතු හා නැවත මිලදී ගැනීම් | 133,378,267 | 58,604,510 |
| මහජන බැංකුව - | 10,017 | 45,093,974 |
| හැටන් නැෂනල් ඉැංකුව | 1,073,683 | 131,943 |
| සම්පත් බැංකුව | 944 | 3,012,935 |
| සුලු මුදල් - ප්‍රධාන කාර්යාලය | 46,233 | 10,372 |
| සුලු මුදල් - කලුතර | 2,656 | 6,949 |
| තැපැල් ගාස්තු අග්‍රිමය | 1,500 | 1,150 |
| | 1,135,033 | 48,257,323 |
| | 134,513,300 | 106,861,833 |

**පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| සංසන්දනාත්මක අනුපාතිකයන් | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| දළ ලාභ අනුපාතිකය | 42.10% | 47.21% | 41.09% | 41.49% | 41.84% |
| තොග පිරිවැටුම් අනුපාතිකය | 6.02Times | 4.07 Times | 4.14Times | 4.28Times | 4.23Times |
| ණයගැතියන්ට පිරිවැටුම් | 9.10% | 8.61% | 8.44% | 8.83% | 6.68% |
| ජංගම අනුපාතිකය | 5.98:1 | 5.81:1 | 4.73:1 | 6.71:1 | 5.56:1 |
| ක්ෂණික වත්කම් අනුපාතිකය | 5.46:1 | 4.94:1 | 3.93:1 | 4.63:1 | 3.95:1 |
| කොටසකට ඉපැයීම (රු.) | Rs.9.33 | Rs.8.24 | Rs.2.39 | Rs.3.62 | Rs.7.12 |
| පිරිවැටුමට මුළු වියදම | 34.55% | 33.01% | 32.86% | 28.97% | 24.82% |
| කොටසකට ලාභාංශය (රු.) | Rs.0.75 | Rs.0.75 | Rs.0.75 | Rs.0.75 | Rs.1.25 |

ප්‍රමාණාත්මක විචලනයන්ට හේතු නිශ්චය වශයෙන් දැන ගත යුතුවේ.

**පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

## 1. සංස්ථාපිත තොරතුරු

### 1.1 වාර්තා කෙරෙන විෂයය

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් ආයතනය සීමිත වගකීම් සහිත සමාගමක් වන අතර එය ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කර පිහිටුවා ඇත. එහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 13, ශ්‍රී රාමනාදන් පාරේ, අංක 100/25 දරණ ස්ථානයේ පිහිටා ඇත..

### 1.2 අධ්‍යක්ෂවරු විසින් මූල්‍ය ප්‍රකාශනයන් අනුමත කිරීම

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2013 නොවැම්බර් 26 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසර දෙන ලදී

### 1.3 සේවක සංඛ්‍යාව

වර්ෂය අවසානයේදී, සමාගමේ සේවක සංඛ්‍යාව 64 ක් විය. (2011 වර්ෂයේදී සේවකයන් 67)

### 1.4 ප්‍රධාන ක්‍රියාකාරකම් හා එහි අවශ්‍යතාව

රසායන ද්‍රව්‍යයන් ආනයනය කර විකිණීම, සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම විය. සමාලෝචිත මුදල් වර්ෂය තුලදී, සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයේ සැලකිය යුතු වෙනස්වීම් සිදු වී නොමැත.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම් වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුව ආයතනයේ ගනුදෙනුවලට අදාළව සත්‍ය හා සාධාරණ තත්වයන් නිරූපණය වන අයුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි.

### 1.6 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ ඇතුලත් වන මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ස්කන්ධ මූලධනයේ සිදු වූ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ගිණුම් ප්‍රතිපත්ති ප්‍රකාශනය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම් වාර්තාකරණ ප්‍රමිතීන්ට, ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිතීන්ට හ 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූලව සකස් කර ඇත.

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය තෙක් එම මූල්‍ය වර්ෂය ද ඇතුලත්ව සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුව ගිණුම් සකස් කර ඉදිරිපත් කර ඇත. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා ප්‍රථම වතාවට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුව 2012 ජනවාරි 01 වන දින පටන් බලපැවැත්වෙන පරිදි ඉදිරිපත් කර ඇත. මෙම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ පිළිබඳ මණ්ඩලය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට සමගාමීව සකස් වී ඇත.

## 2. මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමට යොදාගත් පදනම

### 2.1 වටිනාකම් මැනීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම යටතේ පිළියෙළ කර ඇති අතර, නැවත ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් සඳහා හැර අනෙකුත් වත්කම් අයිතම සඳහා අත්පත් කර ගැනීම් පිරිවැය පදනම් කරගෙන සිදු කර ඇත.

### 2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා භාවිතා කරන ලද විනිමය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා සමාගමේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන සහ ආයතනයේ ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ භාවිතා වන විනිමය වන ශ්‍රී ලංකා රුපියල භාවිතා කර ඇත.

## 3. ගිණුම්කරන ප්‍රතිපත්ති

### 3.1 ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හි සිදු වූ වෙනස්කම්

2011 ජනවාරි 01 වන දින ආරම්භක මූල්‍ය තත්ව ප්‍රකාශනය පරිවර්තනය කිරීම සඳහා භාවිතා කරන ලද ශ්‍රී ලංකා ගිණුම් වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව ආයතනයේ ගිණුම්කරන ප්‍රතිපත්ති ඒකාකාරීව අනුගමනය කර ඇත.

**සංසන්ධනාත්මක අගයන්**

පෙර වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයන් හි ඉදිරිපත් කිරීම් සඳහා ශ්‍රේණිගත කිරීම් අදාළ පරිදි සංශෝධනය කර වඩා යහපත් වාර්තාකරණයන් සඳහා මෙම වසර තුලදී නැවත ඉදිරිපත් කර ඇත.

### 3.2 විශේෂිත ගිණුම් ඇස්තමේන්තු, තිරණ සහ උපකල්පනයන්

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ආදායම්, වියදම්, වත්කම්, වගකීම්, ගිණුම් ඇස්තමේන්තු, ගිණුම්කරණ උපකල්පනයන් සිදු කිරීමට කළමණාකරණයට සිදු වේ. ආයතනයේ ගිණුම්කරන ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීමේ දී අනාගත කාලපරිච්ජේද පිළියෙළ කරනු ලබන ඇස්තමේන්තු, තිරණ හා ඒවායේ පදනම් හා මූලාශ්‍ර සහ වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන යන වටිනාකම්වලට ඉන් වන බලපෑම විමර්ශනයට ලක් කර ඇත.

**දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම**

දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය ක්‍රමය යටතේ සාධාරණ අගය ගිණුම්වල වාර්තා කරනු ලබන අතර ප්‍රත්‍යාගණන අතිරික්ත හිමිකම පිළිබද ප්‍රකාශනයේ දක්වා ඇත. වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු සඳහා ස්වාධින සහ විශේෂඥ තක්සේරුකරුවකු යොදවා වත්කම්වල සාධාරණ අගයන් 2010 දෙසැම්බර් 31 දිනට නිර්ණය කර ඇත.

**බදුකරණය**

සමාගම ආදායම් බද්දට සහ එකතු කළ අගය මත බද්දට හා ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් වේ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියට අනුව සකස් කිරීමේ දී වර්තමාන ආදායම් බද්ද, විලම්භිත බදු වෙන් කිරීම හා වෙනත් බදු වෙන් කිරීම සඳහා ගිණුම්කරණමය ගණනය කිරීම්, ඇස්තමේන්තු හා ගිණුම්කරනමය තිරණ ගිණුම් සඳහා ගලපා ඇත. ගිණුම් පිළියෙළ කරනු ලබන අවස්ථාවන් හිදී නව ගිණුම්කරන ප්‍රමිත සහ බදුකරණමය නිර්වචනයන් අතර අවිනිශ්චිතව පැවතිණ.

**ස්පෘශ්‍ය වත්කම්වල අගය අවප්‍රමාණය වීම**

වත්කම් භාවිතයෙන් ජනනය කර ගත හැකි අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වඩා හොඳ ඇස්තමේන්තුව ඊට අදාළ අවධානම් හා ගලපා ස්පෘශ්‍ය වත්කම් තක්සේරු කර ඇත. මෙවැනි ඇස්තමේන්තු නිරන්තර වෙනස්කම්වලට භාජනය විය හැකි අතර එසේ යම් අගය අඩු වීමෙන් අලාභයක් හදුනා ගනි නම් අදාළ වර්ෂය තුලදී ලාභයට එරෙහිව කපා හරිනු ලැබේ.

## 4. ප්‍රධාන ගිණුම්කරන ප්‍රතිපත්තීන්හි සාරාංශය

### 4.1 විදේශ වෙළඳ ගනුදෙනු

විදේශ වෙළඳ ගනුදෙනු වටිනාකම් ගනුදෙනුවේ දිනට පවතින විනිමය අනුපාතයන් අනුව ගිණුම්ගත කරනු ලැබේ. විදේශ විනිමයන්ගෙන් කරන ලද මූල්‍ය වත්කම් ශේෂ පත්‍ර දිනට පවතින විනිමය අනුපාතිකයන් යටතේ පරිවර්තනය කරනු ලැබේ. පෙර කාලපරිච්ජේදයේදී මිලදී ගනු ලැබූ මූල්‍ය නොවන අයිතමයන් පරිවර්තනය කරනු ලබන දිනට

පවතින අනුපාතිකයන් යටතේ පරිවර්තනය කරනු ලැබේ. විදේශ වෙළඳ ගනුදෙනු වාර්තාකරණයේදී ඇති වන විනිමය හුවමාරු ලාභ අලාභ ආදායමට ගලපනු ලැබේ.

## 4.2 බදු

### වර්තමාන බද්ද

ආදායම් බදු වෙන් කිරීම මූල්‍ය ප්‍රකාශන මගින් නිරූපණය කරනු ලබන ලාභයට 2006 අංක 06 දරණ දේශිය ආදායම් පනතේ දක්වා ඇති ගැලපීම් කිරීමෙන් පසු ගණනය කරනු ලැබේ.

### විලම්බිත බදු

විලම්බිත බදුකරණය වගකීම් ක්‍රමය භාවිතා කර සිදු කරනු ලබන අතර වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන යන වටිනාකම්වල තාවකාලික වෙනස් වීම් වෙන් කිරීම සඳහා සිදු කරනු ලැබේ. වත්කම්වල ලියාහල ගිණුම්කරන අගයට හා බදුකරණ ලියා හල අගය අතර වෙනසට සිදු කරන ලද ගණනය කිරීම, විශ්‍රාම ප්‍රතිලාභ වෙන් කිරීම සඳහා කරනු ලබන ගණනය කිරීමට ගලපා ඇත.

සියලුම පවත්වාගෙන යන අගයන් හී තාවකාලික වෙනස්කම් සඳහා විලම්හිත බදු වෙන් කිරීම සිදු කරනු ලබන අතර හිලව් කිරීමට නොහැකි වූ බදුකරණ අලාභ ඉදිරියේදී බදුකරණ ලාභයෙන් ආවරණය කිරීම සඳහා ඉදිරියට ගෙන යනු ලබයි.

විලම්බිත බදු වත්කම් සෑම ශේෂ පත්‍ර දිනකදීම පසුවිපරමට ලක්කොට ඒවායින් ආවරණය කර ගත යුතු ප්‍රමාණ කොටස් හෝ සම්පූර්ණ වශයෙන් බදුකරණ ලාභයන්ගෙන් ආවරණය කරනු ලැබේ.

## 4.3 දේපල පිරියත හා උපකරණ

### නිර්ණය කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 16 ට  අනුව සහ එම වත්කම භාවිතයෙන් ආයතනයට ඇති වන අනාගත ආර්ථික ප්‍රතිලාභ ගණනය කිරීමෙන් වත්කම්වල වටිනාකම් නිර්ණය කර ඇත.

### ගණනය කිරීමේ පදනම

දේපල පිරියත උපකරණයන්ගේ පිරිවැය හෝ තක්සේරුගත වටිනාකමෙන් එකතු වූ ක්ෂය වීම් සහ අගය අඩු වීම් අඩු කොට වටිනාකම් දක්වා ඇත. දේපල පිරියත උපකරණයන්ගේ අගය අඩු වීම සඳහා අදාළ හේතු සාධක ඇති වන අවස්තාවන්වලදී නිරන්තර විමර්ශනයට භාජනය කර අදාළ ගැලපීම සිදු කරනු ලබයි. දේපල පිරියත උපකරණ නැවත තක්සේරු කරන අවස්තාවලදී අදාළ භාණ්ඩයේ සියලුම වත්කම් අයිතම අගය තක්සේරුකරණයට ලක් කරනු ලබයි.

ප්‍රත්‍යාගණනය කරන ලද දිනට පැවති සමුච්චිත ක්ෂය අගයන් එකිනෙකට හිලව් කොට ලැබෙන ශුද්ධ අගය ප්‍රත්‍යාගණිත අගයන් අතර වෙනස ප්‍රත්‍යාගණිත අතිරික්තය ලෙස ගිණුම්වල වාර්තා කරයි. ප්‍රත්‍යාගණිත වත්කම් විකිණීමේ දී ඊට සම්බන්ධ සංචිතයන් රඳවා ගත් ලාභයන්ට මාරු කර ඇත

### නීතිප්‍රකාර පිළිගැනීම

දේපල භාණ්ඩ, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න නීති ප්‍රකාර ආදේශනය කිරීමෙන් පසු පිළිගැනීමට හෝ බැහැර කිරීමට හෝ මතු පිරිමැසුම් සඳහා ලැබෙන්නා වූ ප්‍රතිලාභ බලාපොරොත්තු විය හැක. නීති ප්‍රකාර පිළිගැනීම් නිසා සිදුවන අලාභ සහ පාඩු එම වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුලින් ඉදිරිපත් කර ඇත.

### වටිනාකම අඩුවීම

මූලික ක්‍රමය අනුව පිරිවැය හෝ මුලු දේපලවල ධාරිතාව, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න සහ නිදහස් ඉඩම් අතහැර, මෙම ගණන් හිලව් කපා හැරීම පිළිබඳව තක්සේරු කිරීම ආර්ථික වත්කම් අනුව සිදුවේ.

නැවත අගය කරන ලද වත්කම්වල වටිනාකම අඩු කිරීම කළ යුත්තේ ඉතිරි ජීවිත කාලය තුල අවශ්‍ය ආර්ථික වත්කම් එකිනෙක භාණ්ඩ උපයෝගි කර ගනිමිනි.

වටිනාකම අඩුවීම සිදුවන්නේ නව පිරිවැය එකතුවීම මත ඇතිවන පහත සඳහන් ක්‍රමය අනුවය.

| දේපල | වාර්ෂික ගණන |
|---|---|
| ගොඩනැගිලි | 5 |
| මෝටර් රථ | 25 |
| සිලින්ඩර් සහ බහාලුම් | 12.5 |
| උපකරණ සහ ආම්පන්න | 12.5 |
| කාර්යාල උපකරණ | 12.5 |
| ගෘහභාණ්ඩ සහ උපකරණ | 12.5 |
| යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍රසූත්‍ර | 12.5 |
| පරිගණක උපාංග | 33.33 |
| පණිවුඩ හුවමාරු සහ සන්නිවේදන ආම්පන්න | 33.33 |
| පාපැදි | 12.5 |

**4.4. මූල්‍ය සාධනපත්‍රය - මූලික හඳුන්වාදීම සහ පසු ඇගයීම**

**මූල්‍ය වත්කම්**

**මූලික හඳුන්වාදීම සහ පසු ඇගයීම**

LKAS 39 අනුව විෂයන් වශයෙන් වර්ග කර ඇත්තේ මූල්‍ය වත්කම් ලාභ හෝ පාඩු අනුව, ණය පහසුකම් හා නැවත ලැබීම, ආයෝජනය කරන ලද මුදල් පරිණත වීම, මූල්‍ය වත්කම් විකිණීම සඳහා යෙදීම වශයෙනි. මූලික හඳුන්වාදීමේදී සමාගම තමන්ගේ මූල්‍ය වත්කම් අනුව වර්ගීකරණය ගැන නිශ්චය කරනු බලයි.

සමාගමේ මූල්‍ය වත්කම්හි මුදල්, කෙටිකාලීන තැන්පතු, වාණිජ සහ අනිකුත් ලැබීම්, ණය පහසුකම් සහ අනිකුත් ලැබීම් ඇතුලත්ව ඇත.

**පසු ඇගයීම**

මූල්‍ය වත්කම් ඇගයීමේ දී ඔවුන්ගේ වත්කම් වර්ගීකරණය පහත සඳහන් ලෙස දැක්වේ:

**ණය සහ ආපසු ලැබීම්**

ණය සහ ආපසු ලැබීම් යනු යම් කිසිවකින් නොලැබුනු මූල්‍ය වත්කම් ස්ථාවර හෝ නිර්ණය ගෙවීම් ලෙස ක්‍රියාකාරී වෙළඳ පොලෙහි දක්වා නොමැත. මූලික ඇගයීමෙන් පසු මෙවැනි මූල්‍ය වත්කම් එම මිලෙන් හිලව් කිරීමත්, සහ EIR ක්‍රමය බලපවත්වමින් පොලිය අඩුකිරීමත් සිදුවේ. හිලව් කිරීමේ මිල ගණන් බැලීමේ දී කිසියම් අඩුකිරීමක් හෝ වාරිකයක් ලබා ගැනීමේ දී හෝ සහ ගාස්තු හෝ මිලගණන් අඛණ්ඩව EIR හි කොටසක් වීමය. මෙම EIR හිලව් කිරීම මූල්‍ය ආදායමක් ලෙස ආදායම් ප්‍රකාශනයේ ඇතුළු කර ඇත. අපවය කිරීමේ දී ඇතිවන අලාභ ආදායම් ප්‍රකාශනයේ පිලිගත් දෙයක් හැටියට අඩංගු වී ඇත.

**මූල්‍ය වගකීම්**

**මූලික හඳුන්වාදීම සහ පසු ඇගයීම**

LKAS 39 හි අඩංගු මූල්‍ය වගකීම් වර්ගීකරණය කර ඇත්තේ ලාභය හෝ අලාභය, ණය දීම් සහ ණය ලබා ගැනීමත් ලෙසය. මූලික හඳුනාගැනීමේ දී මෙම වර්ගීකරණයන් මූල්‍ය වගකීම් ලෙස සමාගම හඳුනාගනියි.

මූලිකවම හඳුනාගත් සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වගකීම්, ණය දීම සහ ණය ගැනීම ක්‍රමානුකූලව ණය හිලවු කරනු ඇත. මෙයට අප්‍රමාදව ආරෝපණය කළ යුතු ගනුදෙනු අගයන් ඇතුලත් කර ඇත.

ගණන් හිලවු සහ අනිකුත් ගෙවීම් සමාගමේ මූල්‍ය වගකීම් වලට ඇතුලත් වේ.

**4.5. පරිලේඛන**

පරිලේඛන මිල කර ඇත්තේ, වටිනාකමට අඩු ලෙස සහ දල මුදල් වීමේ අගයන් අනුවය. දල මුදල් වීමේ වටිනාකම විකුණුම් තක්සේරු මුදලින් සමාප්තිය සඳහා යොදන පිරිවැය සහ විකිණීම සඳහා තක්සේරු කිරීමය.

**4.6. වාණිජ සහ අනෙකුත් ලැබීම්**

ණයකරුවන් සහ අනෙකුත් ලැබිය යුතු දේ වල මිල තක්සේරු කර දළ අධිගත ප්‍රතිපාදන අඩමාන ලැබීම ලෙස නම් කර ඇත.

අවලංගු හා අඩමාන ණය පහත සඳහන් කොන්දේසි අනුව පෙන්වා ඇත.

| | |
|---|---|
| වසර 1 - 2 දක්වා | 25% |
| වසර 2 - 3 දක්වා | 50% |
| වසර 3 ට වැඩි | 100% |

**4.7. මුලය සහ මුලය සමවිල**

මුලය ප්‍රකාශනයේ ස්ථාපිතයේ අඩංගු වී ඇති බැංකුවේ ඇති මුලය ධනය, සහ අතේ රැඳී ඇති මුලය ධනය ප්‍රකාශනයේ ඇති වියදම් සඳහාත්, මුලය සහ මුලය ස්ථාපිතයේ ඇත්තේ මුලය සහ කෙටිකාලීන තැන්පතු අඩංගු වී ඇත.

**4.8. පාරිතෝෂිකය සඳහා නිශ්චිත ප්‍රතිලාභ සැලසුම**

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම අනුව සේවකයෙකුට විශ්‍රාම යන විට ලැබිය යුතු ප්‍රතිලාභ, සාමාන්‍යයෙන් ඔහුගේ විශ්‍රාම යනවිට කළ සේවා කාලය අනුව සිදුවේ. සමාගම සේවකයෙකුට පාරිතෝෂික මුදලක් ගෙවීමට බැඳී සිටින්නේ ව්‍යවස්ථානුකුලව වන අතර, මෙම පාරිතෝෂික දීමනාව නිශ්චිත ප්‍රතිලාභ සැලසුමට අනුව බව පිළිගත යුතුය. මේ සඳහා සමාගම විසින් මුලය ප්‍රකාශනයේ ඇතුලත් කර ඇත. මෙම පාරිතෝෂිකය ලබා දීමේ දී මෙම ප්‍රතිලාභ සැලසුම අනුව ගණනය කිරීමේදී එම සැලසුම් අනුව ඒවා ගණනය කරන්නේ ප්‍රක්ෂිප්ත වැය ඒකක අනුවය. මෙම කාල සීමාව තුල සිදුවන්නා වූ ලාභ හෝ අලාභ මෙම පාරිතෝෂික මුදල් ගෙවීමේ දී බල පානු ඇත.

**නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල**

මුලය ප්‍රකාශනයේ විස්තර සහිතව දායකත්වය ලබා දීම ඉහත සඳහන් ප්‍රකාශනයේ වැය කිරීමක් ලෙස උපයනු ලබන මුලයයන්හි යටත් වේ.

**4.9. වගකීම් සහ ගිවිසුමක ඇතුලත් නියෝග**

ගලාඑන සම්පත් සහ ආර්ථික ප්‍රතිලාභ බැඳීම් හේතුකොට ගෙන පැරණි සිදුවීම් මත දැනට ඇති වී ඇති අවනතභාවය මත නිකුත් කර ඇති මුලය ස්ථාපිතයේ වගකීම් සහ ගිවිසුම් නියෝග ඇතුලත් කර ඇත.

ණය හිමියන් විසින් කරනු ලබන ඉල්ලුම් හෝ ශේෂය දක්වා ඇති දේවල් වර්තමාන වගකීම් ලෙසත් ලේඛන ශේෂ ලේඛන වලට වසරකට පසුව ඉදිරිපත් කරන විට ඒවා වර්තමානයට පෙර වගකීම් ලෙස ශේෂ පත්‍රය අනුව වර්ග කරනු ලැබේ.

**4.10. වාර්තා කිරීමේ කාල පරිච්ඡේදයෙන් පසු සිදුවන සිදුවීම**

මුලය පත්‍රිකා නිකුත් කිරීම සඳහා බලය පැවරීමේ දිනයෙන් අනතුරුව, සිදුවන, මනාප හෝ අවාසි සිදුවීම් වාර්තා කිරීමේ කාලයට පසුව හෝ වාර්තා කිරීමේ කාලය අවසානයේ දී සිදුවිය යුතුය.

මෙම වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවන සිදුවීම් ගැන සිතාමතා නිසි ලෙස සැකසුම් කර හෝ හෙලිදරව් කිරීමෙන් අවශ්‍ය අවස්ථාවලදී මුලය පත්‍රිකා වල වෙනස් කිරීම් සිදුකළ හැක.

**4.11. සිලින්ඩර් සඳහා ලබා ගත් තැන්පත් නැවත ගෙවීම**

සමාගම විසින් නිකුත් කරන ලද සිලින්ඩර් සඳහා පාරිභෝගිකයින්ගෙන් නැවත ගෙවීමේ පදනම මත ලබා ගත් තැන්පතු සිලින්ඩර් බාර දීමෙන් පසු නැවත ගෙවනු ලැබේ. බෙදා හැරීම් නියෝජිත සමග ඇති ගිවිසුම අවලංගු කරන අවස්ථාවේදී, නැවත ලබාදෙන සිලින්ඩර් සඳහා නැවත ගෙවීම් කරන අතර, සමාගමට ලබා නොදෙන සිලින්ඩර් සඳහා ලබාගත් මුදල් සමාගමට සින්න වෙයි.

**4.12. ආදායම පිළිගැනීම**

ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒම නිසා ආදායම ගැන පිලිගැනීමක් ඇති අතර, මේ අනුව ආදායම සහ හවුල් වියදම් ඇතිවීම හෝ ඇතිවීමට සිදුවීම නිසි පරිදි ස්ථිර කළ හැක. ආදායම නිසි පරිදි ගණනය කිරීමට හැක්කේ ලැබෙන්නා වූ ප්‍රතිෂ්ඨාව හෝ ලැබෙන්නා වූ දල වානිජ මට්ටම් සහ අගය එක්කළ බදු, සමාගම තුල සිදුවන්නා වූ විකුණුම් බැහැර කිරීමෙන් පසුවය. පහත සඳහන් විශේෂ මිනුම් දණ්ඩක් ආදායම පිළිගැනීම සඳහා යොදනු ලැබේ.

**භාණ්ඩ විකිණීම**

භාණ්ඩ විකිණීමේ දී මෙම සමූහයේ කළමණාකාරිත්වය මෙම භාණ්ඩ ගැනුම්කරුට අයිතිය පැවරීමෙන් පසු එම භාණ්ඩ සඳහා හවුල් කර ගැනීමක් නොමැති බවත් මෙම භාණ්ඩ ගැන කිසිදු පාලනයක් නොමැති බවත් සනාථ වූ පසු මෙම ආදායම පිලිගනු ලැබේ.

**වෙළඳාම් ප්‍රමාණය සාධක කොට ඇති බදු**

වෙළඳාම් ප්‍රමාණය සාධක කොට ඇති බදු සඳහා අගය එකතු කළ බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, යනාදී බදු නියම පරිදි ක්‍රමානුකූලව ගෙවනු ලැබේ.

**පොලී ආදායම**

සම්භාවී ක්‍රමය අනුස්ථිර පිරිවැය සහ මූල්‍ය පිරිවැයට ලාබෙන පොලිය වර්ග කිරීම තුල විකිණීම, පොලී ආදායම හෝ වියදම වාර්තාගත කිරීම අනුව ප්‍රබල පොලී අනුපාතය (EIR) මෙය අනුව මෙමගින් අනාගත මූල්‍ය ගෙවීම් හෝ ලැබීම්, මූල්‍ය පිරිවැය කාලයට අනුව හෝ කෙටි කාලයකට, සරිලන ලෙස දල ආදායම හෝ වගකීමයි. පොලී ආදායම මූල්‍ය ආදායමේ කොටසක් ලෙස ආදායම් ප්‍රකාශනයේ පෙන්වා ඇත.

**ලාභ සහ අලාභ**

සම්පිඩන ආදායම් ප්‍රකාශනයේ ලාභ සහ අලාභ ලෙස ස්වභාවයෙන් නැගී එන්නේ දේපල, යන්ත්‍ර සහ ආම්පන්න සහ අනිකුත් අවලංගු වත්කම් සහ අනිකුත් තැන්පතු සමාගමේ විශේෂිත මූල්‍ය ප්‍රකාශනයේ පෙන්වා ඇත්තේ විකිණීමෙන් ලැබූ ආදායම අඩු කර එවන් වත්කම් වියදම් වලට යා කිරීමෙනි.

**අනිකුත් ආදායම්**

අනිකුත් ආදායම් සමාගණනය සාධක කොට හඳුනා ගැනීමට හැකිය.

**4.12. වියදම් හඳුනාගැනීම**

යම්කිසි භාණ්ඩයකින් ලැබෙන්නා වූ ආදායම සහ ඍජු පිරිවැය සමග ඇති ඍජු සහභාගිත්වය නිසා, විස්තර සහිත මූල්‍ය ප්‍රකාශනයේ වියදම හඳුනා ගැනීමට හැකිය.

මෙම විස්තර සහිත ප්‍රකාශනයට සමාගම සඳහා යන වියදම, දේපල නඩත්තු කිරීම, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න කාර්යක්‍ෂම ලෙස භාවිතය යන වියදම් සියල්ල මෙම ප්‍රකාශනයට ඇතුලත් කොට ඇත.

**5. ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත (SLFRS/LKAS) නිකුත් කර ඇති නමුත් තවමත් ක්‍රියාකාරී වී නැත.**

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පහත දක්වා ඇති නමුත් ප්‍රමිතීන් නිකුත් කර ඇතත්, ඒවා ක්‍රියාකාරී නොවන බව මෙම ප්‍රකාශන නිකුත් කළ දින දක්වා නොමැත. මෙම ප්‍රමිතීන් ලැයිස්තු ගත කිරීම සහ අර්ථනිරූපණ නිකුත් කර නොමැති අතර, සමාගම ඉදිරි දිනයකදී මෙය බලපානු ඇතැයි විශ්වාස කරනු ලබයි. සමාගම මෙම ක්‍රියාවලිය බලපාන විට ඒවා නිසි පරිදි සම්මත කිරීමට පැහැදි සිටියි.

අ) SLFRS-9 මූල්‍ය ප්‍රකාශන: වර්ගීකරණය සහ ඇගයීම LKAS 39 විස්තර කර ඇති මූල්‍ය වගකීම් මූල්‍ය වත්කම් මැනීම සහ වර්ගීකරණය SLFRS 9 යන ඡේදයට පැවරෙන අතර ඒ ආකාරයෙන් සිදුවේ. මෙම මිනුම වාර්ෂිකව 2015 ජනවාරි 01 වන දින ආරම්භ වේ. සමාගමේ මූල්‍ය වත්කම්හි වර්ගීකරණය හා මිනුම් SLFRS 9 අනුව බලපාන අතර, එයින් මූල්‍ය වර්ගීකරණයකට හෝ වගකීමකට බලපානු නොලැබේ.

ආ) SLFRS 13 සාධාරණ මිල ඇගයීම - SLFRS 13 යටතේ තනි උපදේශකත්වයක් යටතේ මූලාශ්‍රයක් මත සාධාරණ මිලක් නියම කරයි.

**6. SLFRS/LKAS මූලික පිලිගැනීම**

**SLFRS/LKAS** අනුව පිලියෙල කරන ලද මුල්ම මූල්‍ය ප්‍රකාශන 2012 දෙසැම්බර් 31 වනදා අවසන් වන වර්ෂය සඳහාය. 2011 දෙසැම්බර් 31 දින අවසන් වන වර්ෂය සහ ඊට පෙර මෙම මූල්‍ය ප්‍රකාශන පිලියෙල කරන ලද්දේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුව වන අතර එය 2011 දෙසැම්බර් මස 31 වන දා තෙක් බලපායි.

මේ අනුව සමාගම විසින් පිලියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන SLFRS/LKAS 2011 දෙසැම්බර් 31 සඳහා එලෙස අනුකූලව බලපාන ලෙසත් එම SLFRS/LKAS ප්‍රමිතිවලට යටත් වන ලෙසත්, 2012 දෙසැම්බර් 31 වන දිනයෙන් අවසන් වන වර්ෂය විග්‍රහ කර ඇති ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුවය. මෙම මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ දී සමාගමේ මුල් ප්‍රකාශන පිලියෙල කර ඇත්තේ 2011 දෙසැම්බර් 31 වන දිනය වන අතර සමාගම සංක්‍රමණය වී ඇත්තේ 2011 ජනවාරි 01 වන දින පිලියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනයේ දිය. මෙම පත්‍රිකාවෙන් සමාගම විසින් කරන ලද අනුකූලනය නැවත ප්‍රකාශ කිරීම හෝ ප්‍රසිද්ධ කරන ලද 2001 දෙසැම්බර් 31 වන දින SLAS මූල්‍ය ප්‍රකාශන සමග සම්බන්ධ බවයි.

**7. ගිවිසුම පිළිබඳ අධ්‍යක්‍ෂවරුන්ගේ සම්බන්ධතාවය**

ඩී.ජේ.යූ. පුරසිංහ මහතා, ආනන්ද ජයසිරි ගමගේ මහතා, එච්.එම්.ආර්. කිරිඇල්ල මහතා, සරත් කුමාර මහතා, මායලගු ශෂිකරන් මහතා සහ ඩී.එම්.පී.ඒ. දසනායක මහතා යන මහතුන් මෙම වර්ෂය තුල අධ්‍යක්‍ෂවරුන් වශයෙන් සිටින ලදි. ඔවුන් විසින් මෙම සමාගමේ ගිවිසුම් පිළිබඳව කිසිම සම්බන්ධතාවයක් නොතිබුණ බව ප්‍රකාශ කරයි.

## ගිණුම් සඳහා සටහන්

### 2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | | 2012 | 2011 |
|---|---|---|---|
| | | රු. | රු. |
| 1 | **ආදායම** | | |
| | විකුණුම් | 218,811,738 | 188,191,198 |
| | අඩු කරන්න : පිරිවැටුම් බදු | - | - |
| | අඩු කරන්න : ජාතිය ගොඩනැගීමේ බද්ද | (1,517,517) | (1,292,317) |
| | | 217,294,221 | 186,898,881 |
| 2 | **විකුණුම් පිරිවැය** | | |
| | ආරම්භක තොගය | 18,659,970 | 20,501,193 |
| | එකතු කරන්න : මිල දී ගැනීම් | 117,584,101 | 96,817,133 |
| | | 136,244,071 | 117,318,326 |
| | අඩු කරන්න : අවසාන තොගය | (10,420,882) | (18,659,970) |
| | | 125,823,189 | 98,658,356 |
| 3 | **අනෙකුත් මෙහෙයුම් ආදායම** | | |
| | සේවක ණය සඳහා පොලිය | 1,088,679 | 847,918 |
| | ස්ථාවර තැන්පතු, ඒක්ෂණ තැන්පතු, සඳහා පොලිය | 12,846,817 | 4,282,085 |
| | වෙනත් ආදායම් | 1,656,904 | 503,886 |
| | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය | 40,750 | 32,150 |
| | - | 15,633,150 | 5,666,039 |
| 4 | **මෙහෙයුම් ලාභය** | | |
| | පහත දැක්වෙන වියදම් සඳහා අය කිරීමෙන් පසුව මෙහෙයුම් ලාභය දැක්වේ. | | |
| | ක්ෂයය ප්‍රතිපාදන | 14,059,720 | 13,848,797 |
| | විගණක වේතනය | 66,300 | 66,300 |
| | සේවක පිරිවැය (සටහන 4.1) | 29,598,321 | 26,307,088 |
| 4 1 | **සේවක පිරිවැය** | | |
| | වැටුප්, වේතන සහ අනෙකුත් අදාළ වියදම් | 24,967,249 | 21,357,110 |
| | සේවා අවසන් පාරිතෝෂිකය | 838,395 | 1,535,035 |
| | සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල | 3,792,677 | 3,414,943 |
| | | 29,598,321 | 26,307,088 |
| | **පහත දැක්වෙන විස්තර ඉහත ඇතුලත් කර ඇත.** | | |
| | සභාපතිතුමාගේ සහ විධායක අධ්‍යක්ෂතුමාගේ සංවේතන | 1,260,000 | 1,020,000 |
| | අධ්‍යක්ෂ ගාස්තු | 318,000 | 274,800 |
| | | 1,578,000 | 1,294,800 |

| 5 | බදුකරණය | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| | **වර්තමාන ආදායම් බද්ධ** | | | |
| | සාමාන්‍ය කටයුතු පදනම් කරගෙන වර්තමාන බදු (සටහන 5. 1) | 7,022,168 | 9,094,865 | 7,740,748 |
| | පූර්ව වර්ෂයේ අධි ප්‍රතිපාදන සඳහා ගැලපුම් | - | - | - |
| | විලම්බිත ආදායම් බදු ගාස්තුව/(ආපසු හැරවීම) (සටහන 5. 2) | (12,331,790) | (14,355,856) | 4,914,786 |
| | | (5,309,622) | (5,260,991) | 12,655,534 |

| 5.1 | ගිණුම් ලාභය සහ බදු ලාභය සංසන්දනය කිරීම | | | |
|---|---|---|---|---|
| | ගිණුම් අනුව ශුද්ධ ලාභය | 32,015,849 | 31,624,514 | 22,223,548 |
| | අවසර දිය නොහැකි වියදම්වල එකතුව | 17,863,571 | 12,093,712 | 14,628,274 |
| | | 49,879,420 | 43,718,226 | 36,851,822 |
| | අවසර දිය හැකි වියදම්වල එකතුව | (12,079,066) | (11,236,566) | (15,062,242) |
| | බදු අය කල හැකි ලාභය | 37,800,354 | 32,481,660 | 21,789,580 |
| | | | | |
| | බදු අය කිරීම | 7,022,168 | 9,094,865 | 7,626,353 |
| | සමාජ වගකීම් බදු - 1,5% | - | - | 114,395 |
| | | 7,022,168 | 9,094,865 | 7,740,748 |

**5.2 විලම්බිත බදු වියදම්/(ආදායම)**

කාලය වෙන් කිරීමේ වෙනස්කම් හේතු කොට ගෙන 28%

**පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්**
**ගිණුම් සඳහා සටහන**

**6 කොටසකට ඉපැයීම්**

**6.1** කොටසකට මූලික ඉපැයීම් ගණනය කැරෙන්නේ එම වර්ෂය තුළ නොගෙවූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ සාමාන්‍යය තුලින්, සාමාන්‍යය කොටස් හිමියන්ට අයත් සේ සැලකෙන අදාළ වර්ෂය සඳහා ශුද්ධ ලාභය බෙදා දීමෙනි. ප්‍රසාද දීමනා ප්‍රශ්නයක් වැනි, සම්පත්වල අනුරූප වෙනසක් නොමැතිව, නොගෙවූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව වෙනස් කිරීම්වලට භාජනය කැරුණු සිදුවීම් සඳහා මෙම වර්ෂය තුළ සහ පූර්ව වර්ෂය තුළ නොගෙවූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ සාමාන්‍යය ගලපනු ලැබේ.

**6.2** 2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා කොටස් ගණනය කිරීමක මූලික ඉපැයීම්වලදී භාවිතා කෙරුණු ආදායම සහ කොටස් දත්ත පහත පෙන්නුම් කැරේ.

| | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| **ලවයන් වශයෙන් උපයෝගි කළ ප්‍රමාණය** | | |
| ශුද්ධ ලාභය/(පාඩුව) | 37,325,471 | 32,972,626 |
| කොටසකට ඉපැයීම් වෙනුවෙන් සාමාන්‍ය කොටස් හිමියන්ට අයත් සේ සැලකෙන ශුද්ධ ලාභය | 37,325,471 | 32,972,626 |
| **හරයන් වශයෙන් උපයෝගි කැරුණු සාමාන්‍ය කොටස් සංඛ්‍යාව** | | |
| කොටසකට මූලික ඉපැයීම් වලට අදාල නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ සාමාන්‍යය | 4,000,000 | 4,000,000 |
| | 4,000,000 | 4,000,000 |
| කොටසකට ඉපැයීම් | 9.33 | 8.24 |

**7 කොටසකට ලාභාංශයන්**

| | | |
|---|---|---|
| ලවයන් වශයෙන් උපයෝගි කළ ප්‍රමාණය | | |
| **වර්ෂය සඳහා ලාභාංශය** | 5,000,000 | 3,000,000 |
| **හරයන් වශයෙන් උපයෝගි කැරුණු සාමාන්‍ය කොටස් සංඛ්‍යාව** | | |
| කොටසකට ලාභාංශවලට අදාළව නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් | 4,000,000 | 4,000,000 |

8 දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ

| පිරිවැය | ඉඩම් | ගොඩනැගිලි | යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ | ගෘහ භාණ්ඩ සහ වැද්දුම් | කාර්යාල උපකරණ | පරිගණක | මෝටර් වාහන | සිලින්ඩර | පා පැදි | ආවුද සහ උපකරණ | සන්නිවේදන හා මිඩියා උපකරණ | නැවත ප්‍රතිෂ්ඨාපිත වටිනාකම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **වත්කම්වල පවත්වාගෙන යන වටිනාකම්** | | | | | | | | | | | | |
| 2012.01.01 දිනට ශේෂය | 70,000,000.00 | 24,374,517.50 | 1,155,500.00 | 2,203,039.59 | 1,690,500.07 | 1,235,350.00 | 15,488,252.00 | 173,127,704.71 | 2,500.00 | 324,260.00 | - | 289,601,623.87 |
| එකතු කරන්න : වර්ෂය තුල එකතු කිරීම් | - | - | 492,684.00 | 293,485.13 | 382,483.00 | 659,450.00 | 10,500,000.00 | - | | 39,232.00 | 183,750.00 | 12,551,084.13 |
| | | | | | | | | | | | | - |
| අඩු කරන්න : ඉවත් කිරීම් හා මාරු කිරීම් | - | - | - | (130,917.10) | (56,309.00) | (107,900.00) | - | (94,704.78) | | - | - | (389,830.88) |
| 2012.12.31 දිනට ශේෂය | 70,000,000.00 | 24,374,517.50 | 1,648,184.00 | 2,365,607.62 | 2,016,674.07 | 1,786,900.00 | 25,988,252.00 | 173,032,999.93 | 2,500.00 | 363,492.00 | 183,750.00 | 301,762,877.12 |
| **ක්ෂය වීම්** | | | | | | | | | | | | |
| 2012.01.01 දිනට ශේෂය | - | 435,980.00 | 118,459.84 | 496,893.64 | 645,481.31 | 500,427.49 | 5,187,128.96 | 6,693,640.34 | 2,500.00 | 154,305.61 | - | 14,234,817.19 |
| එකතු කරන්න : වර්ෂය සඳහා අය කිරීම් | - | 443,886.60 | 134,916.81 | 334,005.20 | 485,653.80 | 368,663.52 | 5,790,333.98 | 6,378,435.56 | | 76,820.61 | 47,004.16 | 14,059,720.24 |
| අඩු කරන්න : ඉවත් කිරීම් හා මාරු කිරීම් | - | - | - | (127,106.14) | (56,309.00) | (107,900.00) | - | (94,704.78) | | - | - | (386,019.92) |
| 2012.12.31 දිනට ශේෂය | - | 879,866.60 | 253,376.65 | 703,792.70 | 1,074,826.11 | 761,191.01 | 10,977,462.94 | 12,977,371.12 | 2,500.00 | 231,126.22 | 47,004.16 | 27,908,517.51 |
| **2012.12.31 දිනට ශුද්ධ පොත් අගය** | 70,000,000.00 | 23,494,650.90 | 1,394,807.35 | 1,661,814.92 | 941,847.96 | 1,025,708.99 | 15,010,789.06 | 160,055,628.81 | - | 132,365.78 | 136,745.84 | 273,854,359.61 |

| පිරිවැය | ඉඩම් | ගොඩනැගිලි | යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ | ගෘහ භාණ්ඩ සහ වැද්දුම් | කාර්යාල උපකරණ | පරිගණක | මෝටර් වාහන | සිලින්ඩර | පා පැදි | ආවුද සහ උපකරණ | නැවත ප්‍රතිෂ්ඨාපිත වටිනාකම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **වත්කම්වල පවත්වාගෙන යන වටිනාකම්** | | | | | | | | | | | |
| 2011.01.01 දිනට ශේෂය | 70,000,000.00 | 23,500,000.00 | 1,145,420.00 | 2,097,632.10 | 1,576,435.25 | 1,464,830.43 | 12,195,037.00 | 173,127,704.71 | 2,500.00 | 321,847.00 | 285,431,406.49 |
| එකතු කරන්න : වර්ෂය තුල එකතු කිරීම් | - | 874,517.50 | 17,500.00 | 147,122.49 | 122,491.07 | 210,600.00 | 3,293,215.00 | - | | 4,950.00 | 4,670,396.06 |
| | | | | | | | | | | | - |
| අඩු කරන්න : ඉවත් කිරීම් හා මාරු කිරීම් | - | - | (7,420.00) | (41,715.00) | (8,426.25) | (440,080.43) | - | - | | (2,537.00) | (500,178.68) |
| 2011.12.31 දිනට ශේෂය | 70,000,000.00 | 24,374,517.50 | 1,155,500.00 | 2,203,039.59 | 1,690,500.07 | 1,235,350.00 | 15,488,252.00 | 173,127,704.71 | 2,500.00 | 324,260.00 | 289,601,623.87 |
| **ක්ෂය වීම්** | | | | | | | | | | | |
| 2011.01.01 දිනට ශේෂය | - | - | 7,420.00 | 168,821.14 | 64,735.25 | 547,980.43 | - | 94,704.78 | - | 2,537.00 | 886,198.60 |
| එකතු කරන්න : වර්ෂය සඳහා අය කිරීම් | - | 435,980.00 | 118,459.84 | 369,787.50 | 589,172.31 | 392,527.49 | 5,187,128.96 | 6,598,935.56 | 2,500.00 | 154,305.61 | 13,848,797.27 |
| | | | | | | | | | | | - |
| අඩු කරන්න : ඉවත් කිරීම් හා මාරු කිරීම් | - | - | (7,420.00) | (41,715.00) | (8,426.25) | (440,080.43) | - | - | | (2,537.00) | (500,178.68) |
| 2011.12.31 දිනට ශේෂය | - | 435,980.00 | 118,459.84 | 496,893.64 | 645,481.31 | 500,427.49 | 5,187,128.96 | 6,693,640.34 | 2,500.00 | 154,305.61 | 14,234,817.19 |
| **2011.12.31 දිනට ශුද්ධ පොත් අගය** | 70,000,000.00 | 23,938,537.50 | 1,037,040.16 | 1,706,145.95 | 1,045,018.76 | 734,922.51 | 10,301,123.04 | 166,434,064.37 | - | 169,954.39 | 275,366,806.68 |

| පිරිවැය | ඉඩම් | ගොඩනැගිලි | යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ | ගෘහ භාණ්ඩ සහ වැද්දුම් | කාර්යාල උපකරණ | පරිගණකි | මෝටර් වාහන | සිලින්ඩර | පා පැදි | ආවුද සහ උපකරණ | නැවත ප්‍රතිෂ්ටාපිත වටිනාකම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **වත්කම්වල පවත්වාගෙන යන වටිනාකම්** | | | | | | | | | | | |
| 2010.01.01 දිනට ශේෂය | 538,000.00 | 33,673,546.18 | 1,367,343.32 | 2,341,699.45 | 866,513.10 | 2,684,630.43 | 15,221,831.95 | 86,981,891.40 | 8,775.00 | 320,753.22 | 144,004,984.05 |
| එකතු කරන්න : වර්ෂය තුල එකතු කිරීම් | - | - | 14,714.78 | 222,740.23 | 270,300.00 | 609,750.00 | - | 5,400,809.36 | - | - | 6,518,314.37 |
| | | | | | | | | | | | - |
| අඩු කරන්න : ඉවත් කිරීම් | - | - | - | - | (972.00) | (319,000.00) | - | (2,790,958.47) | (4,000.00) | (37,500.00) | (3,152,430.47) |
| මාරු කිරීම් | - | (3,775,941.36) | (1,192,848.18) | (1,183,668.07) | (609,196.62) | (1,685,752.05) | (15,029,703.38) | (52,604,962.18) | (4,775.00) | (250,499.75) | (76,337,346.59) |
| ප්‍රත්‍යාගණනය | 69,462,000.00 | (6,397,604.82) | 956,210.08 | 716,860.49 | 1,049,790.77 | 175,202.05 | 12,002,908.43 | 136,140,924.60 | 2,500.00 | 289,093.53 | 214,397,885.13 |
| 2010.01.01 දිනට ශේෂය | 70,000,000.00 | 23,500,000.00 | 1,145,420.00 | 2,097,632.10 | 1,576,435.25 | 1,464,830.43 | 12,195,037.00 | 173,127,704.71 | 2,500.00 | 321,847.00 | 285,431,406.49 |
| **ක්ෂය වීම්** | | | | | | | | | | | |
| 2010.01.01 දිනට ශේෂය | - | 2,091,676.97 | 1,030,049.43 | 1,119,035.39 | 585,567.68 | 2,144,716.53 | 12,873,812.88 | 46,398,961.65 | 8,774.00 | 273,362.60 | 66,525,957.13 |
| එකතු කරන්න : වර්ෂය සඳහා අය කිරීම් | - | 1,592,559.62 | 170,163.72 | 184,755.45 | 96,916.30 | 660,932.57 | 2,155,890.50 | 8,219,009.69 | - | 11,729.49 | 13,091,957.34 |
| ගැලපීම් | - | 91,704.77 | 55.03 | 48,698.37 | - | - | - | 687,043.65 | 1.00 | 5,444.66 | 832,947.48 |
| | | | | | | | | | | | - |
| අඩු කරන්න : ඉවත් කිරීම් | - | - | - | - | (972.00) | (319,000.00) | - | (2,605,348.03) | (4,000.00) | (37,500.00) | (2,966,820.03) |
| අධි ක්ෂය වෙන් කිරීම් ගැලපීම් | - | - | - | - | (7,580.11) | (252,916.62) | - | - | - | - | (260,496.73) |
| මාරු කිරීම් | - | (3,775,941.36) | (1,192,848.18) | (1,183,668.07) | (609,196.62) | (1,685,752.05) | (15,029,703.38) | (52,604,962.18) | (4,775.00) | (250,499.75) | (76,337,346.59) |
| 2010.12.31 දිනට ශේෂය | - | - | 7,420.00 | 168,821.14 | 64,735.25 | 547,980.43 | - | 94,704.78 | - | 2,537.00 | 886,198.60 |
| **2010.12.31 දිනට ශුද්ධ පොත් අගය** | 70,000,000.00 | 23,500,000.00 | 1,138,000.00 | 1,928,810.96 | 1,511,700.00 | 916,850.00 | 12,195,037.00 | 173,032,999.93 | 2,500.00 | 319,310.00 | 284,545,207.89 |

**8 Revaluation of Property, Plant & Equipments**

දේපල යන්ත්‍රාගාර සහ උපකරණයන් හි වර්තමාන වටිනාකම් මැනිම සඳහා සමාගම ප්‍රත්‍යාගණන ක්‍රමවේදය භාවිතා කරයි. දේපල යන්ත්‍රාගාර සහ උපකරණ සහ උපකරණ ප්‍රත්‍යාගණන කාර්යය සමාගම ස්වාධීන සහ විශේෂ වෘත්තිකයෙකු වශයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ඉටු කරවා ගෙන ඇත. මූර්ත වටිනාකම් තිරණය කිරීමේදි වෙළඳ පොළ වටිනාකම් පාදක කොට ගෙන ඇති අතර යම් වත්කමක් වෙනස්කම්වලට අදාළව ගැලපීම් සිදු කර ඇත. ආසන්නතම ප්‍රත්‍යාගණනය 2010 දෙසැම්බර් ජ් දිනට බලපැවැත්වෙන පරිදි සිදුකර ඇති අතර අදාළ තොරතුරු පහත පරිදි වේ.

| දේපල | තක්සේරු ක්‍රමවේදය | බලපැවැත්වෙන දිනය | දේපල තක්සේරුකරු |
|---|---|---|---|
| පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් හි දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ | විවෘත වෙළඳ පොළ ක්‍රමය | 2010.12.31 දිනට ශේෂය | තක්සේරු දෙපාර්තමේන්තුව |

**9 කෙටි කාලීන ආයෝජන**

| | 2012 | 2011 | 2010 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව | 25,000,000 | - | - |
| ඒක්ෂණ තැන්පතු - සම්පත් බැංකුව | - | 14,962,814 | 33,564,201 |
| ස්ථාවර තැන්පතු - හැටන් නැෂනල් බැංකුව | 3,171,657 | 3,000,000 | 3,000,000 |
| - හැටන් නැෂනල් බැංකුව | 3,975,997 | 3,588,965 | 3,384,576 |
| නැවත මිලදී ගැනීමේ ගිවිසුම් - මහජන බැංකුව | 20,256,289 | 18,647,915 | 17,411,254 |
| - මහජන බැංකුව | 4,026,315 | 3,723,631 | 3,469,195 |
| - මහජන බැංකුව | 2,074,927 | 1,877,343 | 1,756,328 |
| - මහජන බැංකුව - ඒක්ෂණ තැන්පතු | 32,600,000 | - | - |
| ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 6,094,433 | 5,500,000 | - |
| - මහජන බැංකුව | 7,275,074 | 6,608,491 | 6,263,358 |
| - මහජන බැංකුව | 26,665,810 | - | |
| | 2,237,765 | 695,351 | 542,343 |
| | 133,378,267 | 58,604,510 | 69,391,255 |

**10 ප්‍රකාශිත මූල ධනය**

***සමන්විත වන්නේ***

| | | | | |
|---|---|---|---|---|
| දැක්වෙන පරිදි මූල ධන සංචිතය | 68,500,000 | 68,500,000 | | 68,500,000 |
| 40,00,000 සාමාන්‍ය කොටස් | 40,000,000 | 40,000,000 | | 40,000,000 |
| | 108,500,000 | 108,500,000 | - | 108,500,000 |

**11 හිමිකම්වල වෙනත් සංරචක**

**දේපල යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණවල ප්‍රත්‍යාගණන සංචිත**

| | 2012 | 2011 | 2010 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 220,795,490 | 220,795,490 | - |
| වර්ෂය තුලදී ප්‍රත්‍යාගණනයේ අතිරික්ත | - | - | 220,795,490 |
| ප්‍රත්‍යාගණන අතිරික්ත ආපසු හැරවීම | | | |
| වර්ෂය අවසානයේ ප්‍රත්‍යාගණන සංචිතවල ශේෂය | 220,795,490 | 220,795,490 | 220,795,490 |

2010.12.31 දිනට දේපල පිරියත හා උපකරණයන් හි පැවති සාධාරණ වටිනාකම නිර්ණය කිරීම සඳහා සමාගම විසින් වර්ෂය තුලදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කටයුතු ඉටු කරවා ගෙන ඇත 2010.12.31 දින සිට බලපැවැත්වෙන මූල්‍ය ප්‍රකාශනයන් හි සඳහන් වටිනාකම් රජයේ තකසේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් වටිනාකම් මත පදනම් වී ඇත

| වත්කම් කාණ්ඩය | 2010.12.31 දිනට ශුද්ධ පවත්වාගෙන යන අගය | 2010.12.31 දිනට ප්‍රත්‍යාගනිත අගයන් | ප්‍රත්‍යාගනිත සංචිත |
|---|---|---|---|
| | රු | රු | රු |
| ඉඩම් | 538,000 | 70,000,000 | 69,462,000 |
| යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ | 181,790 | 1,138,000 | 956,210 |
| ගෘහ භාණ්ඩ සහ වැද්දුම් | 1,208,140 | 1,925,000 | 716,860 |
| කාර්යාල උපකරණ | 461,909 | 1,511,700 | 1,049,791 |
| පරිගණක උපාංග | 741,648 | 916,850 | 175,202 |
| මෝටර් වාහන | 192,128 | 12,195,037 | 12,002,909 |
| පා පැදි | 1 | 2,500 | 2,499 |
| සිලින්ඩර | 36,892,075 | 173,033,000 | 136,140,925 |
| ආවුද සහ උපකරණ | 30,216 | 319,310 | 289,094 |
| | 40,245,907 | 261,041,397 | 220,795,490 |

12 **විශ්‍රාම ප්‍රතිලාභ බැදීම**

| **පාරිතෝෂික සදහා ප්‍රතිපාදන** | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| 2012.01.01 දිනට ශේෂය | 6,340,393 | 5,241,611 |
| එකතු කලා 2012 වර්ෂය සදහා ප්‍රතිපාදන | 838,395 | 1,535,035 |
| | 7,178,788 | 6,776,646 |
| අඩු කලා වර්ෂය තුලදී මුදලින් ගෙවීම | *(892,382)* | *(436,253)* |
| වර්ෂය අවසානයේ ශේෂය | 6,286,406 | 6,340,393 |

12.1 31.12.2012 දිනට නිර්වචිත ප්‍රතිලාභ වගකීම් වටිනාකම් නිර්ණය කිරීම සදහා යොදා ගත් මූලික පරාමිතික පහත පරිදි වේ

| | 2012 | 2011 |
|---|---|---|
| වට්ටම් ප්‍රතිශතය | 12% | 12% |
| වාර්ෂික වැටුප් වර්ධක ප්‍රතිශතය | 10% | 10% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම | 5% | 5% |

නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ බැදීම 2012 දෙසැම්බර් 31 දිනට ආගණනය කර ඇති අතර ඊට භාවිත කරන ලද ප්‍රධාන උපකල්පන පහත පරිදි වේ.

| 13 | **විලම්භිත බදු** | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| | 01.01.2012 දිනට ශේෂය | 44,361,740 | 58,717,596 | 2,220,917 |
| | වර්ෂයේ මාරු කිරීම් | (12,331,790) | (14,355,856) | 56,496,679 |
| | 31.12.2012 දිනට ශේෂය | 32,029,950 | 44,361,740 | 58,717,596 |

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියනට අනුව ගිණුම් පරිවර්තනයේ දී කරන ලද ප්‍රත්‍යාගණිත වටිනාකම (151,333,490) අනුව 2010.12.31 දිනට රු. 58,717,596 ක විලම්භිත වටිනාකමක් නිර්මාණය වේ මෙම විලම්භිත බදු වගකීම 01.01.2011 දිනෙන් ආරම්භ වන මූල්‍ය වර්ෂයේ සිට තාවකාලික කාල වෙනස අනුව අය කිරීමට හෝ ආපසු හැරවීම සිදු කල යුතුය 2010 වෂර්යේ ආදායම් බදු අනුපාතය (2010 - 35%) 2011 සහ 2012 වර්ෂවලදි අඩු වීමට ලක් වූ නිසා විලම්භිත බදු වගකීම පහත දැක්වෙන පරිදි ආදායම් ප්‍රකාශයට ආපසු හැරවීම සිදුකරන ලදි

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| ආදායම් ප්‍රකාශයට මාරු කිරීම | 12,331,790 | 14,355,856 |

**14 අසම්භාව්‍ය වගකීම්**

ප්‍රමාණාත්මකව සැලකිය යුතු කිසිදු අසම්භාව්‍ය වගකීමක් ශේෂ පත්‍රයට පැමිණ නැත

**15 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්**

ගැලපීම් හෝ අනාවරණය කිරීම් සඳහා අවශ්‍ය වන සිද්ධි කිසිවක් ශේෂ පත්‍ර දින සිට මෙම වාර්තාවේ දිනය දක්වා පැන නැගී නැත

16 **හෙලිදරව් කිරීම්**
**නැවත පිරවීමේ ක්‍රියාවලිය**


වර්ෂය තුලදී කළුතර නාගොඩ නැවත පිරවුම් ඒකකයේ සිදු වූ ක්ලෝරීන් කාන්දුව නිසා අදාළ නැවත පිරවීමේ කාර්යය හොරණ කර්මාන්ත ඒකකයේ පිහිටි නව ස්ථානයකට මාරු කිරීමට සිදු විය මෙම ස්ථානයේ සිදු වූ වෙනස්කම නිසා දළ වශයෙන් වූ ලාභය අඩුවීමට මින් බලපෑමක් ද ඇති විය

හයිඩොලික් පරීක්ෂණ පිරිසිදු කිරීම සහ වියලන වියදම්

හයිඩ්‍රොලික් පරීක්ෂණ පිරිසිදු කිරීම සහ වියලන ගෙවීම් වශයෙන් 31.12.2013 දිනෙන් අවසන් වර්ෂය තුළ දී රු. 2,560,534.34 දරණ ලදි එම පිරිවැය අතරින් 31.12.2012 න් අවසන් වර්ෂයෙන් ඔබ්බට වලංගු හයිඩ්‍රොලික් පරීක්ෂණ සඳහා දරණ ලද රු. 1,917,091.80 2013 වර්ෂයට විතැන් කර ඇත

## ආයතනික සැලැස්ම - උපායමාර්ගික ව්‍යාපාරික ඒකකය

### උපායමාර්ගික ව්‍යාපාරික අංශ





### උපායමාර්ගික ඉලක්ක

**පාර්ශවකරුවන්/සේවාවන්**

- ජල පිරිපහදු ක්‍රියාවලිය
- රබර් ආශ්‍රිත නිෂ්පාදන
- සබන් සහ විෂබීජ නාශක නිෂ්පාදනය
- රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය
- පිහිනුම් තටාක පවිත්‍රකාරක රසායනිකයන් සැපයීම
- බිම සහ ආහාර ඇසුරුම් පිරිසිදුකරණය
- කඩදාසි නිෂ්පාදනය ක්‍රියාවලිය
- ගැල්වනයිස් කර්මාන්තය
- ඉන්දියානු, පාකිස්තාන සහ බංග්ලාදේශ සැපයුම්කරුවන්, හවුල්කරුවන්

## වර්තමාන සංවිධාන සැලැස්ම



## 2012 වසර සඳහා මෙහෙයුම් සහ මුලය දත්ත සහ 2013 වසර සඳහා අයවැයගත සංඛ්‍යා

### පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
### 2012 වසර සඳහා මෙහෙයුම් සහ මුලය දත්ත සහ 2013 වසර සඳහා අයවැයගත සංඛ්‍යා

| | 2011 සත්‍ය | 2012 සත්‍ය | 2013 අයවැය ගත |
|---|---|---|---|
| | Rs.' 000 | Rs.' 000 | Rs.' 000 |
| ජංගම නොවන වත්කම් | 276,111 | 274,599 | 183,385 |
| ජංගම වත්කම් | 166,118 | 193,255 | 90,148 |
| මුලු වත්කම් | 442,229 | 467,854 | 273,353 |
| ස්කන්ධ මූල ධනය සහ බැරකම් | | | |
| මූල ධනය සහ සංචිත | | | |
| කොටස් හිමියන්ගේ පදනම | 362,934 | 397,259 | 241,387 |
| ජංගම නොවන වගකීම් | 50,702 | 38,316 | 12,762 |
| ජංගම වගකීම් | 28,593 | 32,278 | 19,384 |
| මුලු කොටස්, වගකීම් | 442,229 | 467,854 | 273,533 |
| ආදායම් | 186,899 | 217,297 | 273,014 |
| විකුණුම් පිරිවැය | (98,658) | (125,823) | (153,755) |
| දළ ලාභය | 88,240 | 91,471 | 119,240 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 5,666 | 15,633 | 7,850 |
| | 93,906 | 107,104 | 127,090 |
| මෙහෙයුම්වලින් ලැබෙන ලාභය /(පාඩුව) | 27,847 | 32,112 | 39,750 |
| බදු පූර්ව ලාභය/(පාඩුව) | 27,712 | 32,015 | 39,605 |
| බදු ගෙවීමට පසු ශුද්ධ ලාභය/(පාඩුව) | 32,972 | 37,325 | 28,349 |
| කොටසක ඉපයීම | 9.33 | 8.24 | 6.18 |
| කොටසක ලාභාංශ | 0.75 | 0.75 | 0.75 |

## සමාගමේ කාර්යය සාධනය ඇගයීම

වර්ෂ 1975 පටන් කොළඹ 13, ශ්‍රී රාමනාදන් මාවතේ වරාය අධිකාරිය වෙතින් ලබා ගත් ගොඩනැගිල්ලක සිය ප්‍රධාන කාර්යාලය සහ කෝස්ටික් සෝඩා සහ හයිඩ්‍රෝක්ලෝරික් අම්ල ගබඩාව පවත්වාගෙන යනු ලබයි.

සමාගමේ ප්‍රධාන කාර්ය ලෙස රටේ සහ වෙළඳපොල අවශ්‍යතා අනුව ක්ලෝරීන්, කෝස්ටික් සෝඩා සහ හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය ඉන්දියාව, බංග්ලාදේශය සහ පාකිස්තානය වැනි රටවලින් ආනයනය කර විකිණීම හඳුන්වා දියහැක.

ක්ලෝරීන් ගබඩා කිරීමේ කටයුත්ත ඉතා ආරක්ෂිතව ජනාකීර්ණ ප්‍රදේශවලින් බැහැරව කළ යුතු කටයුත්තක් බැවින් ඒ සඳහා කළුතර දිස්ත්‍රික්කයට අයත් හොරණ කර්මාන්තපුරයේ ගබඩාවක් පවත්වා ගෙන යනු ලැබිය.

හොරණ කර්මාන්තපුරයේ පවත්වා ගෙන යනු ලැබූ මෙම සිලින්ඩර් ගබඩා කිරීමේ කටයුත්ත නිසා අප ආයතනයට විශාල මුදලක් පුද්ගලික ආයතනයකට ගෙවීමට සිදු විය. මේ නිසා ආයතනය විසින් කරන ලද ඉල්ලීම සලකා බැලූ එවක කර්මාන්ත සංවර්ධන ගරු අමාත්‍ය කුමාර වෙල්ගම මැතිතුමා ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව අනුව, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන සංකල්පය ක්‍රියාවේ යොදවනු වස් 2006.11.22 වන දින කැබිනට් අනුමැතියෙන් කළුතර පුලර්ටන් කර්මාන්ත ඒකකයේ අක්කර 2ක ඉඩම (ලොට් අංක 558 1/2 සහ 558 2/2) දිගුකාලීන බදු ක්‍රමය යටතේ පරන්තන් කෙමිකල්ස් සමාගමට (2009 නොවැම්බර් 29 වන දින පටන් ක්‍රියාත්මක වන පරිදි) ප්‍රදානය කරන ලදී.

වර්ෂ 2008 වූ මැයි මස 01 වන දින සිට කළුතර පුලර්ටන් කර්මාන්ත ඒකකයේ කි.ග්‍රෑ.900 සිලින්ඩර්වල සිට කි.ග්‍රෑ.68 සිලින්ඩර්වලට ක්ලෝරීන් නැවත පිරවීම ආරම්භ කරනු ලැබීය. මෙම නව ක්‍රියාමාර්ගය සමඟ පුද්ගලික ආයතනයක් වෙත ඇදී ගිය විශාල මුදල් ප්‍රමාණයන් ඉතිරි කර ගැනීමට හැකි විය. විශේෂයෙන් 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. මිලියන 22 ක බදු පෙර ලාභයක්ද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා රු. මිලියන 31 ක බදු පෙර ලාභයක් ද උපයා ඇත.

සමාගම තෝරා ගත් නව රසායන ද්‍රව්‍ය කිහිපයක් විකිණීම 2012 දෙවන කාර්තුවේ සිට ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණ ද මෑත කාලයේ කළුතර පුලර්ටන් ඒකකයේ සිදු වූ ක්ලෝරීන් කාන්දුවත් සමඟ ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලියට ඇති වූ දැඩි බලපෑම නිසා කල් දැමීමට තීරණය කෙරිණි.

ක්ලෝරීන් සැපයුමේ අඛණ්ඩතාවය තහවුරු කිරීම සඳහා සමාගම නැවත පිරවීමේ ඒකකය ස්ථාපිත කිරීම සඳහා සුදුසු විකල්ප ස්ථානයක් සොයාගැනීමේ කටයුත්තේ දැනට තිරත වී සිටියි. කෙසේ නමුදු තාවකාලික පදනම මත හොරණ ප්‍රදේශයේ බාහිර පිරවුම් සැපයුම්කරුවන්ගේ සේවය ලබා ගැනීමට දැනට ආයතනයට සිදු වී ඇත.

මෑත කාලයේ සිදු වූ ක්ලෝරීන් කාන්දුව නිසා පිරවුම් ස්ථානවල සිදු වූ වෙනස්කම් නිසා සමාගමට රු. මිලියන 6.7 ක මූල්‍ය අලාභයක් දැරීමට සිදු විය.

## ආයතනික යහපාලනය

පරන්තන් කෙමිකල්ස් සමාගම උසස් යහපාලන ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීමට දැඩි කැපවීමෙන් බැඳී සිටින ආයතනයකි. යහපාලන සංකල්පය මූලික වශයෙන් ආයතනික ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ සේවකයින් පොදු රීති මාලාවකට සම්බන්ධ කොට සමාගමේ කොටස් හිමියන් සහ ඇල්මක් සහිත සියලු පාර්ශවයන්ගේ අරමුණු සාක්ෂාත් කරනු ලබන සංකල්පයකි. යහ කළමනාකරණය සාරධර්ම රැකගැනීමටත් කළමනාකරණයට සහ ව්‍යාපාර පරිපාලනයට හා ඉන් පාර්ෂවකරුවන්ට හට ද ඉහළ ප්‍රතිලාභයක් ලබා දීමට මග පාදයි. තවද සේවාවන්හි වගකිවයුතුභාවයද යහපාලන ප්‍රතිපත්තිවල තවත් අංගයකි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද යහපාලනය පිළිබඳ රීතිමාලාව මෙන්ම 2007 අංක 07 දරණ සමාගම් පනත සහ ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මූලය රීති සංග්‍රහයට අප සමාගම දක්වන අනුකූලතාවය මෙම ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාවේදී මෙන්ම අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ සහ විගණන කමිටු වාර්තාවේ මැනවින් නිරූපණය කෙරේ.

### අධ්‍යක්ෂ මණ්ඩලය

ආයතනයේ ප්‍රගමනය සහ සාර්ථකත්වය පිළිබඳ මූලික වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමුහිකව දරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය වන ව්‍යවසායකත්ව නායකත්වය ලබා දීම විචක්ෂණ සහ ඵලදායි රාමුවක් තුලදී ලබා දීම නිසා ආයතනයේ අවදානම හඳුනා ගැනීමට කළමනාකරණයට අනගි පිටුවහලක් සපයයි. ඔවුන්ගේ උපක්‍රමික දැක්ම, ආයතනය මූල්‍ය සහ මානව සම්පත ආයතනයේ අරමුණු ලඟා කර ගැනීමට යොදවන බවට සහ කළමනාකරණ ඵලදායිතා අධීක්ෂණය තහවුරු කරයි. එමෙන්ම ආයතනයේ වටිනාකම් සහ ප්‍රමිතීන් ස්ථාපනය කිරීමට සහ කොටස් හිමියන්ගේ මෙන්ම අදාළ වෙනත් පාර්ශවයන් කෙරෙහි වගකීම් ඉටුවන බවට තහවුරුවක් ලබා දෙයි. අධ්‍යක්ෂ මණ්ඩලය කෙරෙහි පැවරෙන විශේෂිත වගකීම් පහත පරිදි වේ.

- ආයතනික අරමුණු,, අයවැය සහ පුරෝකථනයන් නිරන්තර පසුවිපරම
- මෙහෙයුම් සහ ක්ෂේත්‍ර කාර්ය සාධන පසුවිපරම
- ප්‍රාග්ධන ආයෝජන අවස්ථා හඳුනා ගැනීම සහ පෙරගමන්කරුවකු වීම
- ඵලදායි අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කිරීම තහවුරු කිරීම
- ඉතා ඉහළ මට්ටමේ ආචාර ධර්ම සහ නීතිගරුකතාවය තහවුරු කිරීම
- වාර්ෂික ගිණුම් ප්‍රකාශයට පත් කිරීමට අනුමැතිය ලබා දීම
- කොටස් හිමියන්ගේ අනුමැතිය සඳහා වාර්ෂික ලාභාංශ යෝජනා කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිතුමා, භාණ්ඩාගාර නියෝජිත අධ්‍යක්ෂතුමා ඇතුලුව විධායක නොවන අධ්‍යක්ෂවරු හතර දෙනෙකුගෙන් සහ එක් විධායක අධ්‍යක්ෂවරයෙකුගෙන් සමන්විත වන්නේය. ඔවුන්ගේ නම් සහ තනතුරු මතු සඳහන් වේ.

### අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සමාගම් ප්‍රගති වාර්තා නිරන්තරව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී විමර්ශනයට භාජනය කරන අතර ප්‍රමිතිගත න්‍යාය පත්‍රයක් අවශ්‍ය අවස්ථාවලදී අදාළ අමතර කරුණු ද ඇතුලත් කරමින් සාකච්ඡාවට බඳුන් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මසකට වරක් පවත්වනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ද පවත්වනු ලැබේ. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11 ක සහභාගිත්වය පිළිබඳ විස්තර පහත දක්වා ඇති පරිදි වේ.

**අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගිත්වය - 2012**

| අධ්‍යක්ෂවරු | සහභාගි වු රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| ඩී ජේ යු පුරසිංහ මහතා (සභාපති) | 11 |
| ආනන්ද ගමගේ මහතා (විධායක අධ්‍යක්‍ෂ) | 10 |
| එච්. එම්. ආර්. කිරිඇල්ල මහතා (අධ්‍යක්‍ෂ) | 11 |
| ඩී. එම්. පී. ඒ. දසනායක මහතා (අධ්‍යක්‍ෂ) | 11 |
| පී. සරත් කුමාර මහතා (අධ්‍යක්‍ෂ) | 11 |
| එම්. ශෂිකරන් මහතා (අධ්‍යක්‍ෂ) | 10 |

**කළමණාකරන කමිටු රැස්වීම්**

ආයතනයේ සභාපති, සාමාන්‍යාධිකාරී ආයතනයේ ඉහළ කලමණාකාරිත්වය සමඟ අවම වශයෙන් මසකට වරක් රැස්වීමක් පවත්වනු ලබන අතර එහිදි මෙහෙයුම් කටයුතු පිළිබඳ සාකච්ජා කිරීම සහ තිරණ ගැනිම සිදු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙරාතුව ව්‍යාපාරික තිරණ විස්තරාත්මකව විශ්ලේෂණයට ලක් කිරීම හා ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ මූලික තිරණ ගැනිම කළමනාකරණ කමිටුව මගින් ඉටු කෙරේ.

**අධ්‍යක්‍ෂ දූරකාලය විශ්‍රාම ගැන්වීම සහ තෝරා පත්කර ගැනිම**

සෑම වාර්ෂික මහා සභා රැස්වීමකදීම තුනෙන් පංගුවක් වන සංඛ්‍යාවක අධ්‍යක්‍ෂවරුන් විශ්‍රාම ගැන්වෙන අතර (අධ්‍යක්‍ෂවරු තුනෙහි ගුණිතයක් වන අවස්ථාවක ආසන්නතම තුනෙන් එකට) නැවත තෝරා පත් කර ගැනීම සිදු කරනු ලබයි. ආයතනයේ ව්‍යවස්ථාවලිය අනුව පත් කර ගන්නා ලද අධ්‍යක්‍ෂවරයෙකු ඊලඟ වාර්ෂික මහා සභා රැස්වීමේදී නැවත පත් කර ගත යුතුය.

**විගණන කමිටු රැස්වීම්**

විගණන කමිටුව ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කරනු ලබන අතර යහපත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ආයතනය තුල පැවතිමට එය උපකාර වෙයි. විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්‍ෂවරු තිදෙනෙක්ගෙන් සමන්විත වන අතර එහි සභාපතිවරයා මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්‍ෂවරයා වේ. විගණන කමිටුව අවශ්‍ය අවස්ථාවලදී අභ්‍යන්තර විගණකවරුන්, සාමාන්‍යාධිකාරී සහ ඉහළ කළමනාකරණයේ සාමාජිකයන් සිය රැස්වීම්ට සහභාගි කරගනු ලැබේ. විගණන කමිටුව නිරන්තරයෙන්ම අභ්‍යන්තර විගණක වාර්තා, මාසික ප්‍රගති වාර්තා, විකුණුම් වාර්තා, පද්ධති සහ පාලනයන් විමර්ශනයට භාජනය කරන අතර ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දෙනු ලබයි.

**විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගිත්වය - 2012**

| අධ්‍යක්ෂවරු | සහභාගි වු රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| එච්. එම්. ආර්. කිරිඇල්ල මහතා (අධ්‍යක්ෂ) | 08 |
| ඩී. එම්. පී. ඒ. දසනායක මහතා (අධ්‍යක්ෂ) | 08 |
| ජී. සරත් කුමාර මහතා (අධ්‍යක්ෂ) | 08 |

**අභ්‍යන්තර පාලනය**

සමාගමේ කොටස් හිමියන් අපේක්ෂිත ඉහළ ප්‍රතිලාභයන් ලබා දිම සඳහාත් ආයතනයේ වත්කම් සුරක්ෂිතතාව තහවුරු කිරිම සඳහාත් අවශ්‍ය යහපත් අභ්‍යන්තර පාලන පරිසරයන් ඇති කිරිමේ වගකිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. ආයතනයේ ව්‍යාපාරික අවධානම ඵලදායි සහ සුදුසු ක්‍රමවේදයකට අනුකුලව සිදුකිරිමට අවශ්‍ය පද්ධතින් බිහි කිරිම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්තිය වේ. ආයතනයට මුහුණදිය හැකි අවදානම් හඳුනා ගැනිම ඇගයිම සහ අධික්ෂණය සහ විසඳුම් නිර්දේශ කිරිම පිළිබඳ වගකිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුවට පවරා ඇත.

**මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරිම සහ විනිවිද භාවය**

මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුව පිළියෙළ කරනු ලබන අතර වරලත් ගණකාධිකාරි හේමවන්ද සහ සමාගම බාහිර විගණකයන් ලෙස කටයුතු කරනු ලබයි. විගණකයන්ට අවශ්‍ය තොරතුරු සියල්ල සපයා ඇති අතර ඔවුන්ට වෘත්තිමය නිදහස සහිතව මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සිය මතය ප්‍රකාශ කිරිමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සහ ඉහළ කළමනාකරණය වෙතින් අවකාශ ලබා දී ඇත.

**සම්මත ආචාරධර්ම**

අධ්‍යක්ෂවරුන්ගේ විශ්වාසය අනුව ඉහළ මට්ටමේ විනයක්, පැවැත්මක්, ආයතනය තුලදී සේවකයින්ගෙන් බලාපොරොත්තු වන අතර අවංකව සහ කැපවීමෙන් යුතු සේවයක් ද අපේක්ෂා කෙරේ. සියලුම සේවකයන් සිය උපරිම සේවය අප ගනුදෙනුකරුවන්ට, රජයට සහ ජනතාවට ආයතනයේ ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේදී ලබා දිම අත්‍යවශ්‍ය වේ.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

රජයට ගෙවිය යුතු සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් අදාළ කාලසීමාව තුල දී ම ගෙවා නිම කරන අතර (අතිරික්ත ගෙවීම්, ආපසු ඉල්ලීම් ආදියට යටත්ව) සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් වැනි දෑ ද ගෙවිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

**මූල්‍ය වාර්තා සහ ඉදිරිපත් කිරිම්**

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමර්ශනයට ලක් කරන ලද අතර ආයතනයේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ ඉදිරිපත් කිරිම පිළිබඳ සෑහිමකට පත් වේ. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශනය මෙම ගිණුම් ප්‍රකාශනයේ 17 පිටුවේ සඳහන් වේ.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,**

**එච්. එල්. විපුල සිල්වා**
**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

## විගණන කමිටු වාර්තාව

**විගණන කමිටුවේ කාර්යභාරය**

විගණන කමිටුවේ මූල්‍ය වාර්තාකරණය, විගණන ක්‍රියාවලිය හා යහපත් අභ්‍යන්තර පාලන හා අවධානම් කළමනාකරණ පද්ධතීන් අභ්‍යන්තර සම්බන්ධතාව අධ්‍යයනය කිරීම සහ එහි ගුණාත්මක ලක්‍ෂණ, අඩුපාඩු සහ අවශ්‍ය වර්ධනයන් පිළිබඳ අධ්‍යක්‍ෂ මණ්ඩලයට වාර්තා කිරීම විගණන කමිටුවේ මූලික කාර්යභාරය වේ. පහත සඳහන් කාර්ය පිළිබඳ අධීක්‍ෂණය සහ පසුවිපරම විගණන කමිටුවේ කාර්යභාරයට අයත් වේ.

- මූල්‍ය ප්‍රකාශනවල විශ්වසනීයත්වය සහ සම්පූර්ණභාවය
- අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණාත්මකතාවය හා සම්පූර්ණත්වය
- අභ්‍යන්තර හා බාහිර විගණනයේ කාර්යසාධන ඵලදායිතාව
- ව්‍යවස්ථාපිත සහ නීතිමය අනුකූලතාවය

**විගණන කමිටුව**

විධායක නොවන අධ්‍යක්‍ෂකවරුන් තිදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වන අතර මහා භාණ්ඩාගාරයේ නියෝජිත අධ්‍යක්‍ෂකතුමා එහි සභාපතිත්වය දරනු ලබයි. විගණන කමිටුව පහත අධ්‍යක්‍ෂකවරුන්ගෙන් සමන්විත වේ.

ජී. සරත් කුමාර මහතා - විගණන කමිටුවේ සභාපති

එච්. එම්. ආර්. කිරිඇල්ල මහතා - සභාපති

ඩී. එම්. පී. ඒ. දසනායක මහතා - සභාපති

**රැස්වීම සහ සහභාගිත්වය**

විගණන කමිටුව 2012 වර්ෂය සඳහා රැස්වීම් වාර 08 ක් පවත්වා ඇති අතර එහිදී සාකච්ඡා කරන ලද වැදගත් කරුණු අධ්‍යක්‍ෂ මණ්ඩලයට වාර්තා කරන ලදි. විගණන කමිටුවල සහභාගිත්වය පිළිබඳ දත්ත ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාවේ දක්වා ඇත. විගණන කමිටුව අවශ්‍ය අවස්ථාවලදී අභ්‍යන්තර විගණකවරුන්, කළමනාකාර අධ්‍යක්‍ෂ සහ ඉහළ කළමනාකරණයේ සාමාජිකයන් සිය රැස්වීමට සහභාගි කර ගනු ලැබේ.

**කාර්යභාරය**

කෙටුම්පත් ගිණුම් විමර්ශනය, බාහිර විගණක වාර්තාව, අභ්‍යන්තර විගණක වාර්තාව, මාසික ප්‍රගති වාර්තාව, විකුණුම් වාර්තාව සහ වංචා දෝෂ සහ මග හැරීම් ආදි ඇතිවිය හැකි දෝෂ පිළිබඳ සාකච්ඡා කිරීමෙන් සහ පසුවිපරම් කිරීමෙන් විගණක කමිටුව වටිනා කාර්යභාරයක් ආයතනය වෙනුවෙන් ඉටු කරනු ලබයි. අවධානම් අවම කිරීමට සහ පද්ධතිය තව දුරටත් ශක්තිමත් කරමින් වංචා, වැරදි සහ දෝෂ සිදුවීමට ඇති හැකියාව ඉතා අවම කරනු ලබයි.

**අභ්‍යන්තර පාලන පද්ධතිය**

2012 වසර තුල දී අභ්‍යන්තර විගණක වාර්තා සියල්ලම විගණක කමිටුවේ විමර්ශනයට ලක් වූ අතර අභ්‍යන්තර විගණක විසින් ලබා දුන් නිර්දේශ ක්‍රියාවේ යෙදවීමට සිදුවිය.

**අනුකූලතාවය**

විගණන කමිටුව විසින් ව්‍යවස්ථාපිත වෙන් කිරීම් සහ ගෙවීම්වල අනුකූලතාවය හා විශ්වාසදායක යාවත්කාලීන මූල්‍ය තොරතුරු 2007 අංක 7 දරණ සමාගම් පනත පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රීති මාලාවන්, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයත්, ප්‍රසම්පාදන රීති මාලාව සහ රජයේ චක්‍රලේඛවලට අනුකූලව සිදු කිරීමට මහත් පිටුවහලක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දෙන ලදි.

විගණන කමිටුව වෙනුවෙන්,

මයාලඟු ශෂිකරන්
සාමාජික - විගණන කමිටුව

එච් එම් ආර් කිරිඇල්ල
සාමාජික - විගණන කමිටුව

**2013 නොවැම්බර් 01 වන දින**

**පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්**

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය | 2012<br>රු. | 2011<br>රු. | 2010<br>රු. | 2009<br>රු. | 2008<br>රු. |
|---|---|---|---|---|---|
| ආදායම | 217,294,221 | 186,898,881 | 179,531,798 | 191,919,442 | 197,138,351 |
| විකුණුම් පිරිවැය | (125,823,189) | (98,658,356) | (105,762,236) | (111,419,740) | (114,664,051) |
| දළ ලාභය | 91,471,032 | 88,240,525 | 73,769,562 | 80,499,702 | 82,474,300 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම | 15,633,150 | 5,666,039 | 7,454,108 | 5,197,995 | 7,147,331 |
| | 107,104,182 | 93,906,564 | 81,223,670 | 85,697,697 | 89,621,631 |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | (2,554,403) | (2,757,642) | (437,817) | (1,088,055) | (636,850) |
| පරිපාලන සහ ආයතන වියදම් | (72,438,138) | (63,301,162) | (58,148,781) | (54,017,686) | (47,717,879) |
| මූල්‍ය වියදම් | (95,792) | (136,125) | (413,523) | (487,225) | (566,081) |
| බදු පූර්ව ලාභය | 32,015,849 | 27,711,635 | 22,223,548 | 30,104,731 | 40,700,821 |
| බදු අය කිරීම | 5,309,622 | 5,260,991 | (12,655,534) | (15,641,455) | (12,253,105) |
| කාල සීමාව සඳහා ශුද්ධ ලාභය | 37,325,471 | 32,972,626 | 9,568,014 | 14,463,276 | 28,447,716 |
| කොටස්කරුට ගෙවූ ලාභාංශය | 3,000,000 | 3,000,000 | 3,000,000 | 3,000,000 | 3,000,000 |
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ,යන්ත්‍රාගාර සහ උපකරණ | 273,854,360 | 275,366,807 | 70,719,774 | 77,479,027 | 62,619,334 |
| කෙරීගෙන යන වැඩ | 744,330 | 744,330 | 1,319,330 | - | 19,478,169 |
| ජංගම වත්කම් | 193,255,173 | 166,118,013 | 139,778,694 | 112,949,955 | 93,550,613 |
| මුළු වත්කම් | 467,853,863 | 442,229,150 | 211,817,798 | 190,428,982 | 175,648,116 |
| **ස්කන්ධ මූල ධනය සහ බැරකම්** | | | | | |
| **මූල ධනය සහ සංචිත** | | | | | |
| ප්‍රකාශිත මූල ධනය | 108,500,000 | 108,500,000 | 108,500,000 | 108,500,000 | 108,500,000 |
| රඳවා ගත් ලාභය | 288,759,162 | 254,433,691 | 60,544,748 | 54,976,734 | 43,513,459 |
| කොටස් හිමියන්ගේ අරමුල | 397,259,162 | 362,933,691 | 169,044,748 | 163,476,734 | 152,013,459 |
| ජංගම නොවන වත්කම් | 38,316,356 | 50,702,133 | 13,211,284 | 10,128,393 | 6,756,191 |
| ජංගම වත්කම් | 32,278,345 | 28,593,326 | 29,561,766 | 16,823,855 | 16,878,466 |
| මුලු ස්කන්ධ මූල ධනය සහ බැරකම් | 467,853,863 | 442,229,150 | 211,817,798 | 190,428,982 | 175,648,116 |

## රැස්වීම පිළිබඳ දැන්වීම

සමාගමේ 22 වැනි වාර්ෂික මහා සභා රැස්වීම, 2013 දෙසැම්බර් මස 23 වන දින ප.ව. 2.00 ට කොළඹ 13, ශ්‍රී රාමනාදන් පාරේ අංක 100/25 දරණ ස්ථානයේ, පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් ප්‍රධාන කාර්යාලයේ දී පැවැත්වෙනු ඇති බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

**න්‍යාය පත්‍රය**

1. 2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ විගණනය කෙරුණු ගිණුම් ඉදිරිපත් කිරීම සහ ඒ සම්බන්ධව විගණකවරුන්ගේ වාර්තාව පිළිගැනීම.

2. අධ්‍යක්ෂවරුන් විසින් නිර්දේශිත පරිදි ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීම.

3. සමාගමේ ව්‍යවස්ථාවේ 87 සහ 88 යන වගන්ති වලට අනුකූලව අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු නැවත තෝරා පත් කිරීම.

4. 2007 අංක 07 දරණ සමාගම් පනතේ 155 (අ) වගන්තියේ දැක්වෙන පරිදි විගණකවරයා නැවත පත් කිරීම සහ විගණකවරයාගේ ගාස්තු නියම කිරීම.

මණ්ඩලයේ අණ පරිදි,

(එච්. එල්. විපුල සිල්වා)
ලේකම්
2013.11.08

**සටහන් :**

1. රැස්වීමට සහභාගි වී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා හිමිකම් ලබන සාමාජිකයෙකුට, ඔහු වෙනුවෙන් සහභාගි වී ඡන්දය ප්‍රකාශ කිරීම පිණිස පුද්ගලයෙකු පත් කිරීම සඳහා හිමිකම් ඇත.

2. පෙරකලාසිකරුවෙකු, සමාගමේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නොවේ.

3. පෙරකලාසි ආකෘති පත්‍රයක්, මෙම වාර්තාවට අමුණා ඇත.